ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව

# සටහන

32 වෙළුම 3-4 කලාපය 2013 මාර්තු - අප්‍රේල්

# රැකියා වනිතාකරණය සහ ලෝක ආර්ථික සංවර්ධනය



ශ්‍රී ලංකා මහ බැංකුවේ සමාජ හා ආර්ථික විද්‍යා ද්විමාසිකය

# රැකියා වනිතාකරණය සහ ලෝක ආර්ථික සංවර්ධනය

ලොව පුරා සෑම වසරකම මාර්තු 08 වන දින ජාත්‍යන්තර කාන්තා දිනය ලෙස සමරනු ලබයි. මේ සඳහා පදනම වැටුනේ 19 වන සියවසේ අවසන් භාගයේ ය. කාන්තාවන්ට මුහුණ පෑමට සිදුවූ නොයෙකුත් ප්‍රශ්න සහ ගැටලුවලට එරෙහිව පැන නැගුනු කැළඹීම් සහ අවුල් වියවුල් කාන්තා දිනයේ බිහිවීමට හේතු විය. මේ කැළඹීම් වල ප්‍රතිඵල ලෙස එතෙක් කාන්තාවන්ට අහිමිව තිබූ රැකියා අවස්ථා සහ වැටුප් හිමිකම් සහ ඡන්ද අයිතිය වැනි අයිතිවාසිකම් රැසක් දිනාගැනීමට කාන්තාවෝ සමත් වූහ.

අද වනවිට ලෝක ජනගහනයෙන් අඩක් වන කාන්තාවන් ලෝක ශ්‍රම හමුදාවෙන් සියයට 40ක් පමණ නියෝජනය කරයි. ආර්ථික සංවර්ධනයෙහිලා ඔවුන්ගේ දායකත්වය කෙතෙක් පුළුල්වී පවතී ද යත්, රැකියා නියුක්තියේ කාන්තා දායකත්වය ඉහළ යෑම රැකියා වනිතාකරණයක් ලෙස හඳුන්වයි. ඇතැම් රටවල සමාජ, සංස්කෘතික හා දේශපාලන හේතු මත කාන්තා ශ්‍රමයෙන් නිසි ඵල නෙලා නොගත්ත ද බොහෝ රටවල කාන්තා ශ්‍රමය ආර්ථික සංවර්ධනය සඳහා බෙහෙවින් ඉවහල් කොට ගෙන තිබෙනු දක්නට ලැබෙයි. විධිමත් හා අවිධිමත් යන දෙ අංශයෙහි ම කාන්තා ශ්‍රමයෙහි දායකත්වය වසරින් වසර පුළුල් වෙමින් තිබේ. ලෝක සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි සහ අධ්‍යාපන අංශයෙහි කාන්තාවන් ලබා ඇති ප්‍රගතිය මෙහිලා බෙහෙවින් ඉවහල් වී ඇත.

ශ්‍රී ලංකාවේ ද ආර්ථික සංවර්ධනයෙහිලා කාන්තා දායකත්වය කැපී පෙනේ. මෙයට වසර ගණනාවකට පෙර අප රටේ විධිමත් අංශයේ රැකියා සහ වෘත්තීය අවස්ථා හිමිව පැවතියේ පිරිමි පාර්ශ්වයට පමණි. ස්ත්‍රිය දූ දරුවන් හදාවඩා ගනිමින් කුටුම්භයේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කළ යුතු යැයි නීතිමය වශයෙන් පැවරී නොතිබුණත් කටයුතු සිදුකෙරුනේ එසේ ය. එම කටයුතුවල යෙදෙන අතර ම බොහෝ ස්ත්‍රීහු රේන්ද, බීරලු ගෙතීම, රෙදි විවීම, වට්ටි, පෙට්ටි, පැදුරු, මලු විවීම ආදී නොයෙකුත් කර්මාන්තවල නියැලෙමින්, ගොවිතැන් කටයුතුවලට සම්බන්ධ වෙමින් ආර්ථික සංවර්ධනයට රුකුල් දුන්හ. එහෙත් මෙම සාමාන්‍ය රටාවෙන් බැහැරව අප රටේ කාන්තාවන් විසින් ලොව සුවිශේෂී අවස්ථා සනිටුහන් කළ අවස්ථා ද නැත්තේ නොවේ. ලොව ප්‍රථම අග්‍රාමාත්‍යවරිය අප රටින් බිහිවීම ම ඊට කදිම නිදසුනකි.

මේ වන විට ශ්‍රී ලංකා ආර්ථිකයේ බොහෝ ක්ෂේත්‍රවල කාන්තා නියෝජනය කැපී පෙනෙන මට්ටමකට පිවිස ඇත. ගුරු වෘත්තිය, හෙද සේවය වැනි බොහෝ වෘත්තීය ක්ෂේත්‍රවල බහුලව යෙදී සිටින්නේ කාන්තාවන් ය. එමෙන්ම ව්‍යාපාරික සහ කළමනාකරණ ක්ෂේත්‍රවල ද කාන්තා ශ්‍රමයෙහි දායකත්වය ද ඉහළ යමින් පවතී. එමෙන් ම, ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපදවාලීමෙහිලා කාන්තාවන්ගේ කැපකිරීම සුවිශාල ය. විශේෂයෙන්ම අපනයන ආදායම තුළ සියයට 40ක පමණ ප්‍රතිශතයක් නියෝජනය කරන ඇඟලුම් ක්ෂේත්‍රයේ සේවයේ නියුක්ත වූවන්ගෙන් සියයට 90ක් පමණ ම කාන්තාවන් ය. එපමණක් නොව ගෘහ සේවිකාවන් ලෙස විදෙස් ගත වන කාන්තාවන්ගේ සංක්‍රාම ආදායම් ද මෙරට ආර්ථිකය නංවාලීමෙහිලා බෙහෙවින් ඉවහල් වෙයි. එමෙන් ම තේ සහ රබර් ආදී වතු වැවිලි අංශයේ සේවයේ නියුතු කම්කරු කාන්තාවෝ ද ස්වයං රැකියාවල නියුතුවූ කාන්තාවෝ ද මෙරට ආර්ථික සංවර්ධනයෙහිලා දායක වෙති.

සංවර්ධනයෙහිලා කාන්තා ශ්‍රමයෙහි සහභාගිත්වය ඉහළ යෑම පොදුවේ ලොව බොහෝ රටවල දක්නට ලැබෙන ප්‍රවණතාවකි. වර්තමානයේ මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු වෙමින් පවතී. ඒ පිළිබඳව විවිධ අධ්‍යයන සිදුකෙරෙයි. සංවර්ධනය සඳහා කාන්තා දායකත්වය ඉහළ නංවනු වස් කාන්තාවන් සවිබල ගැන්වීමට නොයෙකුත් ආකාරයෙන් පියවර ගනී. මෙසේ ලෝක ආර්ථික සංවර්ධනයෙහිලා කාන්තාවන්ගේ ශ්‍රම දායකත්වය ඉහළ යෑම පිළිබඳව මෙවර සටහන කෙටි විමසුමක යෙදෙයි.✪


**සටහන** ISSN 1391-3697

2013 මාර්තු/ අප්‍රේල්

පිටපතක මිල : රු. 10.00
වාර්ෂික දායකත්වය : රු. 240.00 (තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

සන්නිවේදන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් පහත සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ


ලිපි යොමුව


| ලිපි යොමුව | පිටුව |
|---|---|
| කාන්තාව සහ සංවර්ධනය | 3 |
| යහපත් ක්ෂුද්‍ර මූල්‍ය පරිචයන් | 9 |
| සේවක අර්ථසාධක අරමුදල එදා, අද සහ හෙට | 12 |
| ස්වෛරීත්ව ධන අරමුදල් පිළිබඳ හැඳින්වීමක් | 19 |



"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

# කාන්තාව සහ සංවර්ධනය

**විනීතා හේරත්**

සන්නිවේදන දෙපාර්තමේන්තුව

**හැඳින්වීම**

ලෝක ජනගහනයෙන් සියයට 50ක් පමණ ම කාන්තාවන් ය. එමෙන් ම ලෝක ශ්‍රම හමුදාවෙන් සියයට 40 ක් නියෝජනය කරන්නේ ද කාන්තාවන් ය. ආර්ථික සංවර්ධනයෙහිලා මොවුන්ගෙන් ඉටුවන කාර්යභාරය සුවිශාල ය. උදාහරණ වශයෙන් ලොව කෘෂිකාර්මික ශ්‍රම හමුදාවෙන් සියයට 43 ක් කාන්තාවන්ගෙන් සමන්විත වේ. විවිධ රටවල ආර්ථික සංවර්ධනයෙහිලා කාන්තාවන්ගේ සහභාගිත්වය නොයෙකුත් සමාජ, සංස්කෘතික හා දේශපාලන බලපෑම් මත සීමා වී පවතී. එහෙත් පොදුවේ ගත් විට සමස්ත ලෝකයෙහි ම සංවර්ධනයෙහිලා කාන්තාවෝ විශාල දායකත්වයක් දක්වමින් සිටිති. එමතු නොව එය තවදුරටත් පෙර නොවූ විරූ පරිදි වර්ධනය වෙමින්, පුළුල් වෙමින් පවතී. ඇතැමෙක් පවසන්නේ නැගී එන ආර්ථික අතර චීන ආර්ථිකයේ පිබිදීමටත්, නව තාක්ෂණයේ පිබිදීමටත් වඩා වේගයෙන් ආර්ථික සංවර්ධනයෙහිලා කාන්තාවන්ගේ සහභාගිත්වය වැඩි වෙමින් පවතින බවයි. 1997-2007 අතර කාන්තාවන් මිලියන 200ක් අලුතින් ශ්‍රම වෙළෙඳපොළට එක්වූ අතර මෙම වර්ධනය රැකියා වනිතාකරණය (Feminisation of Employment)[1] යන සංකල්පය ප්‍රචලිතවීමට හේතු විය. එමෙන් ම මෙසේ සමාජමය හා ආර්ථිකමය වශයෙන් කාන්තාව ශක්තිමත්වීම, ව්‍යාපාරික හා වෙනත් විවිධ ක්ෂේත්‍රවල ප්‍රගමනය උදෙසා කාන්තාවන්ගෙන් ඉටුකෙරෙන කාර්යභාරය පිළිබඳව ඇගයීම, අධ්‍යයනය කිරීම හා විශ්ලේෂණය කිරීමට වනිතාර්ථික විද්‍යාව (Womenomics) යන යෙදුම වර්තමානයේ භාවිතයට ගැනෙයි. කෙසේ වෙතත් ලොව බොහෝ රටවල කාන්තාව අතින් ඉටුකෙරෙන කටයුතු සම්භාරය මුලුමනින් ම මැනීමක් කෙරෙන්නේ නැත. විධිමත් හා අවිධිමත් අංශවල නිශ්චිත රාමුවක් තුළ කෙරෙන ක්‍රියාකාරකම්වල ගණනයක් සිදු කෙරුණ ද බොහෝ විට සංවර්ධනය වෙමින් පවත්නා සහ අඩු සංවර්ධිත රටවල කාන්තාවන් විසින් මෙකී රාමුවෙන් පිටත ඉටුකරනු ලබන කාර්යභාරය බොහෝ විට මෙම මිණුම් තුළට අසුවන්නේ නැත. එහෙත් වර්තමානයේ ඒ පිළිබඳව බොහෝ දෙනෙකුගේ අවධානය යොමුවී ඇති බවක් දක්නට ලැබෙයි. ආර්ථික සංවර්ධනයෙහිලා කාන්තා සහභාගිත්වය වර්ධනය කිරීම මඟින් ඵලදායීතාව ඉහළ නැංවිය හැකි ආකාරය පිළිබඳව අධ්‍යයනය කරනු දක්නට ලැබෙයි.

පොදුවේ ගත්විට ලොව කාන්තාවන් විෂයෙහිලා දැකිය හැකි කැපී පෙනෙන ලක්ෂණ වනුයේ ඔවුන්ගේ ආයු අපේක්ෂාවෙහි ඉහළ යෑමත් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඔවුන් හිමිකරගෙන ඇති සහ හිමිකරගනිමින් සිටින ප්‍රගතියත් වෘත්තීය සහ කළමණාකරණ මට්ටමේ රැකියාවන්හි ඔවුන්ගේ නියෝජනය ඉහළ යමින් පැවතීමත් ය. එමෙන් ම අඩු සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල කෘෂිකර්මය, අපනයන සැකසුම් කර්මාන්ත කටයුතු හා ශ්‍රම විගමනය සම්බන්ධව ද කාන්තාවන්ගේ දායකත්වය කැපී පෙනේ. මෙසේ වර්තමානයේ විවිධ ක්ෂේත්‍ර ඔස්සේ කාන්තාව ලොව ආර්ථික ක්‍රියාවලිය හා සම්බන්ධ වන ආකාරය පිළිබඳව කෙටි විමසුමක යෙදීම මෙම ලිපියේ අරමුණ වේ.

**ආර්ථික සංවර්ධනය සඳහා දායකත්වය**

ආර්ථික සංවර්ධනය සඳහා කාන්තාවෝ විවිධ ආකාරයෙන් සිය ශ්‍රමය කැප කරත්. සෘජුව ම නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධවීමෙන් මෙන් ම, සිය කුටුම්භය තුළ මනා ආර්ථික කළමනාකරණයක් පිහිටුවීමට හා පවත්වාගෙන යෑමට පියවර ගනිමින් අනාගත ආයෝජනයේ සුවිශේෂී මූලාශ්‍රයක් වන නිරෝගී, සෞඛ්‍ය සම්පන්න සහ දැනුමින් පොහොසත් දරු පරපුරක් සඳහා සිය ශ්‍රමය කැප කරමින් සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධ වෙති.

ආර්ථික වර්ධනය සහ කාන්තා ශ්‍රම සහභාගිත්වයෙහි ඉහළ යෑම අතර සෘජු සම්බන්ධතාවක් පවතී. ලෝක දළ දේශීය නිෂ්පාදිතය සඳහා කාන්තාවන්ගේ දායකත්වය සියයට 40 කැයි ගණන් බලා ඇත. එහෙත් මෙම ගණන් බැලීම්වලට හසු නොවන සුවිශල් කාර්යභාරයක් කාන්තාව අතින් ඉටු කෙරෙයි. විශේෂයෙන් ම අඩු සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල කාන්තාවන් නියැලෙන අවිධිමත් අංශයේ ක්‍රියාකාරකම් රැසක් ගණන් ගැනීම්වලට අසුවන්නේ නැත. සඳට ඇති දුර කි.මී. 394,400 ක් නම් දකුණු අප්‍රිකාවේ කාන්තාවන් සමූහය එක්ව නිවසට අවශ්‍ය වතුර ගෙන ඒමට දිනකට ගමන් කරන දුර 16 වතාවක් හඳට ගොස් ආපසු ඒමට ගමන් කරන දුරට සමාන ය.[2] එහෙත් මෙම ආර්ථික කටයුතු සංවර්ධනය මැනීමේ දී

1. Women working in the shadows: The informal economy and export processing zones.

2. http://www.unifem.org/gender_issues/women_poverty_economics/facts_figures.html

අවධානයට හෝ ගණන් බැලීමට හෝ ලක්වන ඒවා නොවේ. ඔවුන් ශ්‍රමබලකාය තුළ හිඳිමින් ඊට යම් වටිනාකමක් එකතු නොකොට, ශ්‍රම සහභාගිත්වයක් නොදක්වන පිරිසක් ලෙස ගණන් බැලීම් රාමුව තුළ සිටිය ද ආර්ථික ක්‍රියාවලිය තුළ දැවැන්ත කාර්යභාරයක් ඉටුකරමින් සිටියි. ලොව ඇතැම් ප්‍රදේශවල කෘෂිකාර්මික ශ්‍රමයෙන් සියයට 70ක් සැපයෙන්නේ කාන්තාවන් ගෙනි. ආහාර නිෂ්පාදනයෙන් සියයට 90 ක් නිපදවන්නේ කාන්තාවන් ය. ශ්‍රී ලංකාවේ ද දේශීය කෘෂිකර්මය තුළ මෙන් ම තේ සහ රබර් වගාව ආදී වතු වගාව ආශ්‍රිතව ද කාන්තා ශ්‍රමය බහුලව යොදා ගැනෙයි. ඔවුහු කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන අතර ම කුටුම්භය තුළ කුදු මහත් සියලු මෙහෙවර ඉටුකරති. පරිභෝජනය උදෙසා ගෙවතු වගාවේ යෙදෙති. වෙළෙඳපොළ හා ගනුදෙනු කරති. එහෙත් ලොව කිසිදු තැනෙක මෙම සමස්ත ක්‍රියාවලිය ම ජාතික නිෂ්පාදිතය මැනීමේ දී සැලකිල්ලට ගනු ලබන්නේ නැත. මෙක්සිකෝවෙහි වැටුප් ලබන කාන්තාවන් සිය රැකියාවෙහි නියැලීමට අමතරව සතියකට පැය 33 ක් නිවසේ කටයුතු සඳහා යොදවයි. පිරිමින් ඒ සඳහා කැප කරන්නේ සතියකට පැය 6 ක් පමණි. ආජන්ටිනාව, නිකරගුවාව, ඉන්දුනීසියාව, දකුණු කොරියාව, දකුණු අප්‍රිකාව සහ ටැන්සානියාව යන රටවල් 6 හි කාන්තාවන් පිරිමින්ට වඩා දෙගුණයකටත් වඩා වැඩි කාලයක් ගෙවීම් නොලබන ගෘහස්ත කටයුතු සඳහා යොදවයි. ඉන්දියාවෙහි මෙම අනුපාතය 10:1 කි. ශ්‍රී ලංකාවේ ද රජයේ හෝ පෞද්ගලික අංශයේ හෝ රැකියාවල නියුතු බොහෝ කාන්තාවන් නිවසේ කටයුතු සඳහා කැපකරන කාලය පිළිබඳ නිශ්චිත ගණන් බැලීමක් සිදුකරන්නේ නැත ද ආසන්න වශයෙන් මෙකී කාලයේ සමාන්‍යය සතියකට පැය 35 - 40 ක් පමණ වනු ඇත. ලොව රටවල් රැසක ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශ්වය එකම රැකියාවල නියුතුවන්නේ වුව ද ඇතැම් අවස්ථාවල ඔවුනට ගෙවන නාමික වැටුප් අතර වෙනස්කම් පවතිනු දක්නට ලැබෙයි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් විට දෛනික වැටුප් ගෙවීමේ දී මෙවැනි විෂමතා දක්නට ලැබෙයි. (01 වන සංඛ්‍යා සටහන) ඇතැම් අවස්ථාවල මහා මාර්ග, නිවාස හා ගොඩනැගිලි ඉදිකිරීම් අංශයේ ද කාන්තා ශ්‍රමය යොදාගනු ලබන අවස්ථාවල ඔවුනට ලැබෙන්නේ සාපේක්ෂව අඩු වැටුපකි. වැටුප් ක්‍රමවල පවත්නා මෙම පරතරය ඉහළ ඵලදායීතාවක් ලබාගැනීමට බාධාවකි. ගොල්ඩ්මන් සැක්ස් (Goldman Sachs) ආයතනය පවසන පරිදි විවිධ රටවල ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයට සමාන වැටුප් ගෙවීමෙන් එම රටවල දළ දේශීය නිෂ්පාදිතය වර්ධනය කළ හැක. ඒ අනුව යුරෝ කලාපයේ දළ දේශීය නිෂ්පාදිතය සියයට 13 කින් ද ජපානයේ සියයට 16 කින් ද එක්සත් ජනපදයේ සියයට 9 කින් ද ඉහළ නැංවිය හැකි බැව් ගොල්ඩ්මන් සැක්ස් ආයතනය සඳහන් කරයි. 2012 ලෝක සංවර්ධන වාර්තාව (World Development Report 2012) ද කාන්තාවන්ගේ නිපුණතා සහ කුසලතා උපරිම ධාරිතාවයෙන් භාවිතයට ගැනීම ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා බෙහෙවින් ඉවහල් වන බව සඳහන් කරයි. එම වාර්තාව මෙයට උදාහරණ ලෙස මලාවි සහ ඝානාවේ ගෙවිලියන්ට, ගොවියන්ට හා සමානව පොහොර සහ වෙනත් කෘෂිකාර්මික යෙදවුම් ද ණය පහසුකම් යනාදිය ද ලබා දෙන්නේ නම් මලාවියේ ඉරිඟු අස්වැන්න සියයට 17කින් ද ඝානාවේ සියයට 16කින් ද ඉහළ නැංවිය හැකි බැව් පවසයි. එමෙන් ම ඇතැම් රටවල විවිධ ක්ෂේත්‍රවල කාන්තාවන්ට ඇති බාධක හා අවහිර ඉවත් කරන්නේ නම් ඵලදායීතාව සියයට 25 කින් ඉහළ නැංවීමට හැකිවන බව වාර්තාව තවදුරටත් සඳහන් කරයි.

**01 වන සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකාවේ අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප්**

(වාර්ෂික සාමාන්‍ය රුපියල්)

| | 2008 | 2009 | 2010 |
|---|---|---|---|
| **තේ වගාව** | | | |
| පිරිමි | 440 | 448 | 543 |
| ගැහැණු | 305 | 356 | 391 |
| **රබර් වගාව** | | | |
| පිරිමි | 500 | 532 | 588 |
| ගැහැණු | 377 | 416 | 463 |
| **වී ගොවිතැන** | | | |
| පිරිමි | 562 | 613 | 658 |
| ගැහැණු | 395 | 423 | 453 |

**මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2012**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**අපනයන ආදායම් ඉපයීමට කාන්තා දායකත්වය**

1997 දී ලොව රටවල් 93 ක අපනයන සැකසුම් කලාප 845ක් පැවතිනි. 2006 වන විට අපනයන සැකසුම් සහිත රටවල් ගණන 130ක් විය. එමෙන් ම අපනයන සැකසුම් කලාප ගණන 3500 ක් දක්වා ඉහළ නැග තිබිණි. 1996 - 2006 දශකය තුළ ලොව අපනයන සැකසුම් කලාපවල සේවයේ නිරත වූවන්ගේ සංඛ්‍යාව මිලියන 22.5 සිට මිලියන 66 ක් දක්වා තුන් ගුණයකින් ඉහළ ගොස් ඇත. මින් 2/3 ක් පමණ ම එනම් මිලියන 40 ක් නියෝජනය කරන්නේ චීන අපනයන සැකසුම් කලාපවල ශ්‍රමිකයන් ය. 2006 දී ශ්‍රී ලංකාවේ අපනයන සැකසුම් කලාපවල රැකියාවල නියුතු වූවන්ගේ සංඛ්‍යාව 410,851 ක් විය. 2002 වසරෙහි එම සංඛ්‍යාව 111,033 කි. අපනයන සැකසුම් කලාපවල සේවයේ නිරත බහුතරයක් කාන්තාවන් ය. සංවර්ධනය වෙමින් පවත්නා රටවල අපනයන සැකසුම් කර්මාන්ත අංශයේ ශ්‍රම හමුදාවෙන් සියයට 60 - 80ක් පමණ කාන්තාවන් ගෙන් සමන්විත වෙයි. සමහර කලාපවල මෙම ප්‍රතිශතය සියයට 90ක පමණ ඉහළ අගයක් ගනී.

ශ්‍රී ලංකාවෙහි ද ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය යටතේ පිහිටුවන ලද අපනයන සැකසුම් කලාප කිහිපයකි. රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදනය මෙම අපනයන සැකසුම් කලාපවල බහුලව සිදු කෙරේ. ශ්‍රී ලංකාවේ ද රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදන අංශයේ රැකියාවල නියුතුවන්නන්ගෙන් බහුතරයක් වන්නේ කාන්තා පක්ෂයයි. මොවුන්ගෙන් සියයට 75 ක් පමණ වයස අවුරුදු 25 හෝ ඊටත් වඩා ලාබාල වයසෙහි පසුවන කාන්තාවන් ය. ආසියා, අප්‍රිකා, ලතින්

ඇමෙරිකා හා කැරිබියන් රටවල අපනයන සැකසුම්වලින් කෙරෙන අපනයන, එම රටවල සමස්ත අපනයන තුළ විශාල ප්‍රතිශතයක් නියෝජනය කරයි. (02 වන සංඛ්‍යා සටහන)

**02 වන සංඛ්‍යා සටහන**

**තෝරාගත් ආර්ථික කිහිපයක අපනයන සැකසුම් කලාපවල අපනයන - එම රටවල සමස්ත අපනයනවල ප්‍රතිශතයක් ලෙස**

2002 - 2006

| රට | 2002 | 2006 |
|---|---|---|
| පිලිපීනය | 87 | 60 |
| මැලේසියාව | 83 | 83 |
| මෙක්සිකෝව | 83 | 47 |
| වියට්නාමය | 80 | 80 |
| කෙන්යාව | 80 | 87 |
| බංගලාදේශය | 60 | 76 |
| මැඩගස්කරය | 38 | 80 |
| කොලොම්බියාව | 9 | 40 |

**මූලාශ්‍රය: Women Working in the Shadows: The Informal Economy and Export Processing Zones**

අපනයන සැකසුම් කලාපවල රැකියාවල නිරතවන කාන්තාවන්ගේ ප්‍රතිශතය පිළිබඳව විමසා බැලීමේ දී ඔවුන් එම ආර්ථිකවලට විදේශ විනිමය ඉපයීමෙහිලා කෙතෙක් දායක වන්නේද යන්න පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ අපනයන ආදායම තුළ රෙදිපිළි සහ ඇඟලුම්වල දායකත්වය සැලකිය යුතු කොටසක් නියෝජනය කරයි. 2002 සහ 2003 වසරවල ශ්‍රී ලංකාවේ අපනයන ආදායමින් සියයට 50කටත් වඩා උපයා දෙන ලද්දේ රෙදිපිළි සහ ඇඟලුම් අපනයනය මඟිනි. මෙම ප්‍රතිශතය ක්‍රමානුකූලව පහළ බැස 2010 සහ 2011 වසර වන විට පිළිවෙලින් සියයට 38.91ක් සහ 39.69ක් බවට පත්ව ඇත. ඒ අනුව වාර්ෂිකව රෙදිපිළි සහ ඇඟලුම් අපනයනයෙන් උපයන රුපියල් මිලියන 463,509 ක් පමණ වන ආදායම ශ්‍රී ලංකා ආර්ථිකයට එකතු කිරීමට කාන්තාවන් රැසක් සිය ශ්‍රමය කැප කරයි. අපනයන සැකසුම් කලාපවල සේවයේ නිරත වන කාන්තාවන් විසින් උපයන ආදායම බොහෝ විට ඔවුන්ගේ පවුල්වල ප්‍රධාන ආදායම උත්පාදන මාර්ගයක් වේ. ඔවුන්ගේ ආදායමින් සැලකිය යුතු කොටසක් වැය කරනු ලබන්නේ පවුලේ ආහාර, සෞඛ්‍ය හා අධ්‍යාපන ආදී කටයුතු වෙනුවෙනි.

**විදේශ සංක්‍රාම**

ආර්ථික සංවර්ධනයේ දී විගමන ශ්‍රමිකයන්ගේ දායකත්වය ද ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. 2008 වසරෙහි සංවර්ධනය වෙමින් පවත්නා රටවල විදේශවලට සංක්‍රමණය වූ ශ්‍රමිකයන් විසින් උපයන ලද මුදල ඩොලර් බිලියන 305කි. එය එකී රටවල් ලද ආධාරවලට වඩා තුන් ගුණයක් විශාල ය. 2010 වසරෙහි දකුණු ආසියානු කලාපයේ ඍජු විදේශ ආයෝජනවල වටිනාකම ඩොලර් බිලියන 28ක් වූ අතර සංක්‍රාම ලැබීම් එමෙන් තුන් ගුණයකට ආසන්න අගයක් ගෙන ඇත. එනම් 2000 වසරේ දී ඩොලර් බිලියන 17 ක් වූ දකුණු ආසියානු කලාපයේ සංක්‍රාම ලැබීම් 2010 වසරේ දී ඩොලර් බිලියන 80ක් දක්වා වර්ධනය වී තිබේ. ආසියාවේ හා ලතින් ඇමෙරිකාවේ විදේශ සේවා නියුක්තිකයන්ගෙන් සියයට 50ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හෝ කාන්තාවන් ය. 2010 වන විට පිලිපීන කාන්තාවන් 975,000ක් විදේශ රැකියාවල නියුතුව සිටි අතර ඔවුන්ගේ සංක්‍රාම ආර්ථිකයට එකතු කළ වටිනාකම පේසෝ බිලියන 35.5ක් විය. එමෙන් ම පෙර වසරට සාපේක්ෂව 2010 වසරෙහි කාන්තාවන්ගේ සංක්‍රාමවල වර්ධනය සියයට 9.1ක් විය.

ශ්‍රී ලංකාවේ රැකියා සඳහා විදේශවලට සංක්‍රමණයවීම පිළිබඳව විමසා බලන විට දිනකට ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයේ ම 700කට අධික පිරිසක් විදේශ රැකියා සඳහා පිටත්වී යන බැව් දක්නට ලැබෙයි. 2003 - 2007 වසරවල රැකියා සඳහා විදේශවලට සංක්‍රමණය වූවන්ගෙන් අඩකටත් වඩා කාන්තාවෝ වූහ. 2005 වසරට පෙර මෙම ප්‍රතිශතය සියයට 60කටත් වඩා ඉහළ අගයක් ගත් බැව් දක්නට ලැබෙයි. (03 වන සංඛ්‍යා සටහන)

2009 වසරේ විදේශ රැකියා සඳහා සංක්‍රමණය වූවන්ගෙන් අඩකටත් වඩා එනම් සියයට 51.7ක් කාන්තාවෝ වූහ. 2010 සහ 2011 වසරවල මෙම ප්‍රතිශතය පිළිවෙලින් සියයට 48.8ක් සහ 48.3ක් ලෙස පහළ බැස තිබේ. මෙහිලා කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ ගෘහ සේවය සඳහා යන කාන්තාවන්ගේ සංඛ්‍යාවෙහි පහළ වැටීමයි. (04 වන සංඛ්‍යා සටහන) ඒ වෙනුවට වෘත්තීය, මධ්‍යම හා ලිපිකරු මෙන් ම පුහුණු සහ නුපුහුණු අංශ යටතේ විදේශ ගතවූ කාන්තාවන් සංඛ්‍යාවෙහි ඉහළ යෑමක් දක්නට ලැබේ. කෙසේ වෙතත් කාන්තාවන් නිපුණතා අනුව රැකියා සඳහා විදේශවලට සංක්‍රමණයවීම විමසා බැලීමේ දී දැකිය හැකි කැපී පෙනෙන ලක්ෂණයක් නම් ගෘහ සේවිකාවන් ලෙස විදෙස්ගත වූ කාන්තාවන්ගේ ප්‍රතිශතය සෙසු සියලු ම අංශ අභිභවා සිටින බවයි. එනම්, රැකියා සඳහා විදේශ රටවලට යන කාන්තාවන්ගෙන් සියයට 85 ක් පමණ ම ගෘහ සේවිකාවන් ලෙස කටයුතු කිරීමට විදෙස් ගත වෙයි. මෑත වර්ෂවල රැකියා සඳහා විදෙස්ගත වන කාන්තාවන්ගේ ප්‍රතිශතයෙහි අඩුවීමක් දක්නට ලැබුණත් ආසන්න වශයෙන් එය සියයට 50 ක පමණ අගයක් ගනී.

රැකියා සඳහා සංක්‍රමණය වන රටවල් පිළිබඳව විමසා බැලීමේ දී සියයට 90 කටත් වඩා වැඩි පිරිසක් යන්නේ මැද පෙරදිග රටවලට බව දක්නට ලැබේ. මේ නිසා 2003 -2011 දක්වා සෑම වසරක ම විදේශ සේවා නියුක්තියෙන් ඉපයූ ප්‍රේෂණවලින් සියයට 60කට ආසන්න ප්‍රමාණයක් මැද පෙරදිග රටවල ප්‍රේෂණ ය. (05 වන සංඛ්‍යා සටහන) 2011 වසරෙහි මැද පෙරදිග සේවා නියුක්තියෙන් ලද ප්‍රේෂණ රුපියල් මිලියන 335,201 ක් විය. ගෘහ සේවිකාවන් ලෙස විදේශගත වන කාන්තාවන් විශාල ප්‍රමාණයක් මැද පෙරදිග

03 වන සංඛ්‍යා සටහන

**කාන්තාවන් රැකියා සඳහා සංක්‍රමණයවීම**

**2003 -2011**

| වර්ෂය | විදේශ රැකියා සඳහා සංක්‍රමණය වූ කාන්තාවන්ගේ සංඛ්‍යාව | විදේශ රැකියා සඳහා සංක්‍රමණය වූ කාන්තාවන්ගේ ප්‍රතිශතය | ගෘහ සේවය සඳහා සංක්‍රමණය වූ කාන්තාවන් සංඛ්‍යාව | ගෘහ සේවිකාවන් ලෙස සංක්‍රමණය වූ කාන්තාවන්ගේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 2003 | 135,338 | 64.5 | 102,011 | 75.37 |
| 2004 | 134,010 | 62.4 | 110,512 | 82.47 |
| 2005 | 137,394 | 59.4 | 125,154 | 91.09 |
| 2006 | 111,778 | 55.3 | 99,711 | 89.20 |
| 2007 | 114,983 | 52.6 | 102,176 | 88.86 |
| 2008 | 122,267 | 48.8 | 107,923 | 88.27 |
| 2009 | 127,745 | 51.7 | 113,678 | 88.99 |
| 2010 | 130,657 | 48.8 | 112,752 | 86.30 |
| 2011 | 127,090 | 48.3 | 107,816 | 84.83 |

**මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2008 - 2012**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

රටවලට සංක්‍රමණය වන අතර එම නිසා මෙම ප්‍රේෂණ තුළ ඔවුන්ගේ නියෝජනය ඉතා ඉහළ අගයක් ගනී. එමෙන් ම වෙනත් රැකියා සඳහා සංක්‍රමණය වූ කාන්තාවන්ගේ ප්‍රේෂණ ද එකතු කළ විට විදේශ විනිමය ඉපයීමෙහිලා ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කාන්තාවන් කැපී පෙනෙන කාර්යභාරයක් ඉටුකරන බව පැහැදිලි වේ.

එමෙන් ම සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මුලු අපනයනවල ප්‍රතිශතයක් ලෙස ක්‍රමාණුකූලව ඉහළ යෑමක් දක්නට ලැබේ. 2003 වසරෙහි සියයට 27.5ක් වූ එම ප්‍රතිශතය 2011 වන විට සියයට 48.7ක් දක්වා ඉහළ නැග ඇත.

04 වන සංඛ්‍යා සටහන

**නිපුණතාව අනුව කාන්තාවන් විදේශ රැකියා සඳහා නික්ම යෑම**
**2009 - 2011**

| | 2009 | | 2010 | | 2011 | |
|---|---|---|---|---|---|---|
| | කාන්තාවන් සංඛ්‍යාව | ප්‍රතිශතය | කාන්තාවන් සංඛ්‍යාව | ප්‍රතිශතය | කාන්තාවන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
| වෘත්තීය, මධ්‍යම හා ලිපිකරු මට්ටමේ රැකියා | 1,960 | 1.53 | 1,964 | 1.50 | 2,012 | 1.58 |
| පුහුණු රැකියා | 5,380 | 4.21 | 6,417 | 4.91 | 6,582 | 5.18 |
| අර්ධ පුහුණු රැකියා | 361 | 0.28 | 562 | 0.43 | 440 | 0.35 |
| නුපුහුණු රැකියා | 6,366 | 4.98 | 8,962 | 6.86 | 10,240 | 8.06 |
| ගෘහ සේවය | 113,678 | 88.99 | 112,752 | 86.30 | 107,816 | 84.83 |
| **එකතුව** | **127,745** | **100.00** | **130,657** | **100.00** | **127,090** | **100.00** |

**මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2012**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

එමෙන් ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල විගමන ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ජාතික ආදායම තුළ ඉතා වැදගත් මූලාශ්‍රයක් වෙයි. 2010 වසරෙහි දකුණු ආසියානු කලාපීය රටවල සංක්‍රාම ලැබීම් පිළිබඳව විමසා බැලීමේ දී නේපාලයේ සංක්‍රාම ලැබීම් එරට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 20ක් විය. බංගලාදේශය, ශ්‍රී ලංකාව, පකිස්ථානය සහ ඉන්දියාව යන රටවල මෙම ප්‍රතිශතය පිළිවෙලින් සියයට 9.6, 6.9, 4.8 සහ සියයට 3ක් විය.

**අධ්‍යාපනයෙහි වර්ධනය**

ලොව සෑම රටකම පාහේ ප්‍රාථමික අධ්‍යාපන අංශයෙහිලා පිරිමි ළමුන් සහ ගැහැණු ළමුන් අතර කලක් තිබූ පරතරය ඉතාමත් ම වේගයෙන් තුරන්වී ඇත. ද්විතීයික අධ්‍යාපනය කරා යොමුවීම පිළිබඳව විමසා බලන විට ගැහැණු ළමුන් ද පිරිමි ළමුන් හා සමානව ම ද්විතීයික අධ්‍යාපනය කෙරෙහි යොමුවීමක් දක්නට ලැබෙයි. ඇතැම් රටවල ද්විතීයික අධ්‍යාපනය ලබන ගැහැණු ළමුන්ගේ සංඛ්‍යාව පිරිමි ළමුන්ගේ සංඛ්‍යාව ඉක්මවා සිටී. විශේෂයෙන් ම ලතින් ඇමෙරිකාවේ, කැරිබියන් දූපත්වල සහ නැගෙනහිර ආසියාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ගැහැණු ළමුන්ගේ සහභාගිත්වය කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇත. 2006 වසරෙහි ලතින් ඇමෙරිකාවේ හා කැරිබියන් හී ද්විතීයික අධ්‍යාපනයට ඇතුළත්වූ ගැහැණු ළමුන්ගේ අනුපාතය පිරිමි ළමුන් 100:107ක් විය. නැගෙනහිර ආසියාවේ මෙම අනුපාතය පිරිමි ළමුන් 100කට ගැහැණු ළමුන් 101ක් විය. අග්නිදිග ආසියාවේ පිරිමි ළමුන් 100කට ගැහැණු ළමුන් 102ක් විය. සංවර්ධනය වෙමින් පවත්නා රටවල් 45 ක ද්විතීයික අධ්‍යාපනය අතින් ගැහැණු ළමුන් පිරිමි ළමුන් අභිභවා සිටී. තෘතීයික අධ්‍යාපන අංශය පිළිබඳව විමසා බැලීමේ දී රටවල් 60 ක විශ්වවිද්‍යාල සිසුවියන්ගේ සංඛ්‍යාව සිසුන්ගේ සංඛ්‍යාව ඉක්මවා සිටී. ලොව විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් ගෙන් අඩකටත් වඩා ගැහැණු ළමුන් ය. යුරෝපයේ සහ උතුරු ඇමෙරිකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන්නන්ගෙන් සියයට 60ක් කාන්තාවන් ය. 2005 දී ආර්ථික සහයෝගීතාව හා සංවර්ධනය පිළිබඳ සංවිධානයට අයත් (Organization for Economic Cooperation and Development) රටවල උපාධිධාරීන් අතර කාන්තා ප්‍රතිශතය සියයට 57 ක් විය. 2015 වන විට මෙම සංවිධානයට අයත් රටවල් 10 උපාධිධාරී කාන්තා ප්‍රතිශතය සියයට 60 ඉක්මවනු ඇතැයි අපේක්ෂිත ය (OECD Report, Higher Education to 2030). 2020 වන විට මෙම ප්‍රතිශතය හංගේරියාවෙහි සියයට 73, ඉතාලිය සියයට 70, එක්සත් රාජධානිය සියයට 72 ක් සහ ස්වීඩනයේ සියයට 76 ක් වනු ඇතැයි පුරෝකථනය කර තිබේ. (06 වන සංඛ්‍යා සටහන)

ශ්‍රී ලංකාවෙහි ද පිරිමි ළමුන්ට සාපේක්ෂව ගැහැණු ළමුන් විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීම ඉහළ යන බවක් දක්නට ලැබේ. ඒ අනුව 2008/2009, 2009/2010 සහ 2010/2011 අධ්‍යයන වර්ෂවල ගැහැණු ළමුන් විශ්ව විද්‍යාලවලට ඇතුළත්වීමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 57.65, 58.16 සහ 60.02ක් ලෙස ඉහළ ගොස් ඇත. මෙම ප්‍රවණතාව බොහෝ රටවල දක්නට ලැබෙන්නකි.

බ්‍රසීලයෙහි සෑම වසරක ම විශ්ව විද්‍යාලවලින් උපාධි ලබන ගැහැණු ළමුන්ගේ ප්‍රතිශතය සියයට 60ක් පමණ වේ. දකුණු අප්‍රිකාවේ ද විශ්ව විද්‍යාල සිසුවියන්ගේ සංඛ්‍යාව සිසුන්ගේ සංඛ්‍යාව ඉක්මවා සිටී.

මෙසේ කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටමේ වර්ධනයත් සමඟ ම විවිධ ක්ෂේත්‍රවල රැකියා නියෝජනයේ කාන්තා දායකත්වය ද ඉහළ යමින් පවතී. ඒ අනුව 2000 වසරේ සිට යුරෝ කලාපයේ මිලියන 8 ක් වූ ඉහළ මට්ටමේ රැකියා අවස්ථාවලින් සියයට 75ක් සපිරුනේ කාන්තාවන්ගෙනි. 2007 සිට එක්සත් ජනපදයේ කළමනාකරණ සහ වෘත්තීය මට්ටමේ රැකියා අවස්ථාවන්ගේ කාන්තා නියෝජනය සියයට 51ක් විය. ආසියානු රටවල් අතුරින් කාන්තාවන් ඉහළ

**05 වන සංඛ්‍යා සටහන**

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**

**2003 - 2011**

| | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|---|---|---|---|
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ (රුපියල් මිලියන) | 136,475 | 158,291 | 195,256 | 224,663 | 116,226 | 316,118 | 382,801 | 465,371 | 569,103 |
| මැද පෙරදිග | 77,579 | 87,871 | 111,179 | 128,282 | 160,502 | 189,039 | 229,298 | 279,688 | 335,201 |
| වෙනත් | 58,896 | 70,420 | 84,077 | 96,381 | 116,226 | 127,079 | 153,503 | 185,683 | 233,902 |
| මැද පෙරදිග (මුලු ප්‍රේෂණවල % ක් ලෙස) | 56.9 | 55.5 | 56.8 | 57.1 | 58 | 59.8 | 59.9 | 60.1 | 58.9 |
| අපනයන ඉපයීම්වල %ක් ලෙස | 27.5 | 27.1 | 30.6 | 31.4 | 32.7 | 36 | 47 | 47.8 | 48.7 |

**මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2012**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

මට්ටමේ කළමනාකරණ තනතුරු හෙබවීම අතින් මුල් තැනට එන්නේ සිංගප්පූරුවයි. කාන්තාවන් කනිෂ්ඨ තනතුරු හෙබවීමෙහිලා චීනය පළමු තැන ගනී.

1980 සිට ලොව සියලු ම ප්‍රදේශවල කාන්තාවන්ගේ ආයු අපේක්ෂාව පිරිමින්ගේ ආයු අපේක්ෂාවට වඩා ඉහළ ගොස් ඇත. 1960 දී අඩු ආදායම් රටවල කාන්තාවන් ගේ සාමාන්‍ය ජීවිත අපේක්ෂාවට වඩා වර්තමානයේ ඔවුන්ගේ ජීවිතාපේක්ෂාව අවුරුදු 20කින් ඉහළ ගොස් ඇත. 2001 වසර වන විට ලොව කාන්තාවන්ගේ ආයු අපේක්ෂාවෙහි සාමාන්‍ය අවුරුදු 72ක් විය. සංවර්ධිත රටවල කාන්තා ආයු අපේක්ෂාව අවුරුදු 81ක් වන අතර අඩු සංවර්ධිත රටවල අවුරුදු 70ක් වේ. දකුණු ආසියානු කලාපයේ ඉහළම කාන්තා ආයු අපේක්ෂාව වාර්තාවන්නේ ශ්‍රී ලංකාවෙන් වන අතර එය අවුරුදු 78කි. මෙසේ කාන්තාවන් සෞඛ්‍ය සම්පන්නවීම සහ අධ්‍යාපනය තුළින් ඔවුන්

**06 වන සංඛ්‍යා සටහන**

**ආර්ථික සහයෝගීතාව හා සංවර්ධනය පිළිබඳ සංවිධානයට අයත් රටවල් කිහිපයක උපාධිධාරී කාන්තාවන්**

(මුලු උපාධිධාරීන්ගේ ප්‍රතිශතයක් ලෙස)

| | වර්ෂය | | |
|---|---|---|---|
| **රට** | **2005** | **2015** | **2020** |
| ඔස්ට්‍රේලියාව | 56 | 62 | 62 |
| චෙච් ජනරජය | 57 | 55 | 61 |
| ඩෙන්මාර්කය | 59 | 66 | 68 |
| ප්‍රංශය | 56 | 65 | 66 |
| ජර්මනිය | 53 | 65 | 61 |
| හංගේරියාව | 64 | 66 | 73 |
| ඉතාලිය | 59 | 68 | 70 |
| ජපානය | 49 | 49 | 54 |
| කොරියාව | 49 | 54 | 56 |
| පෝලන්තය | 66 | 63 | 62 |
| ස්විට්සර්ලන්තය | 43 | 49 | 48 |
| තුර්කිය | 44 | 35 | 37 |
| එක්සත් රාජධානිය | 58 | 72 | 72 |
| එක්සත් ජනපදය | 58 | 61 | 57 |
| ස්වීඩනය | 63 | 74 | 76 |

**මූලාශ්‍රය: The Reversal of Gender Equalities in Higher Education ( An Ongoing Trend in Higher Education to 2030 - Volume 1: Demography (OECD 2008)**

බලගැන්වීම ඔවුන් කෙරෙහි ම පමණක් බලපාන්නේ නැත. එය රටක අනාගතය, මතු පරපුර වෙනුවෙන් කෙරෙන අගනා ආයෝජනයකි. කාන්තාවන් තමන් උපයන ආදායමින් විශාල කොටසක් ළමුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා යොදවයි. ඔවුන්ගේ පෝෂණය සහ සෞඛ්‍යය වෙනුවෙන් යොදවයි. එය අනාගතයේ ආර්ථිකය මත යහපත් බලපෑම් ඇති කිරීමට පදනමක් සැපයීමකි. මෙසේ වර්තමාන ලෝක ආර්ථිකය තුළ කාන්තා නියෝජනය ක්‍රමාණුකූලව වර්ධනය වෙමින් පවතී. එහෙත් එය තවමත් එහි ධාරිතාවෙන් ප්‍රයෝජනයට ගෙන ඇත්තේ ඉතාමත් ම සුලු කොටසකි. 2010 නැගෙනහිර ආසියාවේ ශ්‍රම බලකායේ කාන්තා ප්‍රතිශතය සියයට  67 ක් වූ අතර එය ලොව කලාප අතරින් ඉහළ ම කාන්තා ශ්‍රමබල නියෝජනය යි. ලෝක ශ්‍රම බලකායේ කාන්තා ප්‍රතිශතයේ සාමාන්‍ය සියයට 53ක් පමණ වේ. මැද පෙරදිග හා උතුරු අප්‍රිකාවේ මෙම ප්‍රතිශතය තරමක් පහළ අගයක් ගනී. 2010 වසරේ කටාර්, සවුදි අරාබිය හා එක්සත් අරාබි එමිරේට් රටවල මෙම ප්‍රතිශතය පිළිවෙලින් සියයට 36, 15 හා 14 විය. විවිධ රටවල් හා කලාප සම්බන්ධව මෙවැනි විෂමතා පැවතීමට සමාජ, සංස්කෘතික සාධක හෝ දේශපාලන බලපෑම් හෝ හේතු වෙයි.

ආසියා පැසිපික් කලාපයේ රටවල් 21ක් සම්බන්ධ කොට ගෙන එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සිදුකරන ලද අධ්‍යයනයකට අනුව, කාන්තාවන්ගේ ශක්‍යතාවන්ගෙන් ඵල ලබා නොගැනීමේ හේතුවෙන් කලාපයේ දළ දේශීය නිෂ්පාදිතයට වාර්ෂිකව ඩොලර් බිලියන 42 - 47ක ප්‍රමාණයක් අහිමි වෙයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි තොරතුරුවලට අනුව ලොව පුරා අවුරුදු 20 - 65 අතර කාන්තාවන් බිලියනයක් පමණ එනම් කාන්තා ජනගහනයෙන් සියයට 25ක් පමණ ද්වීතියික අධ්‍යාපනය ප්‍රමාණවත් මට්ටමින් නොලැබීම නිසා හෝ ඔවුන්ගේ පවුල්වලින් හෝ සමාජයෙන් හෝ දේශපාලන හා සමාජ, සංස්කෘතික පරිසරය විසින් හෝ ඉඩ ලබා නොදීම හේතුවෙන් ප්‍රධාන ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ නොවී සිටිති. ඔවුන් ගෙන් සියයට 95ක් පමණ නැගී එන ආර්ථිකවල වෙසෙන කාන්තාවන් ය. ලෝක ආර්ථිකයේ වර්ධනය සඳහා මෙම පිරිස ශක්තිමත් සම්පතක් වන අතර එම සම්පතින් නිසි ඵල නෙලා නොගෙන අපතේ යෑම පිළිබඳව අවධානය යොමුකළ යුතුව ඇත.

## කෙටියෙන්

ලෝක ආර්ථික සංවර්ධනය සඳහා කාන්තා දායකත්වය පෙර නොවූ විරූ පරිදි වර්ධනය වෙමින් පවතී. කාන්තා සෞඛ්‍ය  සහ සහ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ඇතිවී තිබෙන ප්‍රගතිය විසින් ඊට මනා පසුබිමක් සපයයි. ඒ ඔස්සේ ලෝක ආර්ථිකය තුළ විවිධ ක්ෂේත්‍ර ඔස්සේ කාන්තාවෝ සංවර්ධනයට දායක වෙමින් සිටිති. එහෙත් මෙම සහභාගිත්වය සීමා කෙරෙන බාධක රැසක් ද පවතී. ඒවායෙහි ප්‍රමාණය ඒ ඒ රටවල සමාජ, සංස්කෘතික හා දේශපාලන බලපෑම් මත තීරණය කෙරෙන අතර එමඟින් නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ කර නොගත් විශාල ශ්‍රමයක් තවමත් අපතේ යමින් පවතී. මෙම ශ්‍රමය නිෂ්පාදන ක්‍රියාවලිය තුළට ඇද ගැනීමෙන් සහ ශ්‍රම වෙළෙඳපොළ තුළ කාන්තා ශ්‍රමිකයන්ට පවත්නා වැටුප් විෂමතා සහ ණය සහ වෙනත් සහනාධාර ආදිය ලබාගැනීමේ අවහිරකම් මඟ හැරවීම ලෝක ආර්ථිකයෙහි සංවර්ධනය සඳහා ඉතාමත් ම හිතකර වනු ඇත.✪

# යහපත් ක්ෂුද්‍ර මූල්‍ය පරිචයන්

**කාංචනා ආරියසිංහ**

ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂිකා, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව

### ක්ෂුද්‍ර මූල්‍ය

ක්ෂුද්‍ර මූල්‍ය යනු, “කුඩා ප්‍රමාණයේ ව්‍යවසායකයින්ට අතිරේක ඇප ආවරණ මත කෙටි කාලීන කාරක ප්‍රාග්ධන සැපයීමේ ක්‍රම වේදයක් සහ දුප්පත්කම අඩු කර ගැනීමේ උපාය මාර්ගයක්” ලෙස දුප්පතුන්ට ආධාර කිරීම සඳහා වන උපදේශක කණ්ඩායම (Consultative Group to Assist the Poorest CGAP) විසින් අර්ථ දක්වා ඇත. එමෙන් ම “දිළිඳු හා අඩු ආදායම්ලාභී කුටුම්භවලට හා කුඩා ප්‍රමාණයේ ව්‍යවසායකයන්ට ණය ලබා දීම, ඉතුරුම් තැන්පතු ලබා ගැනීම, මුදල් ප්‍රේෂණ, ගෙවීම් පහසුකම්, රක්ෂණ සේවා ආදී පුළුල් පරාසයක මූල්‍ය සේවා සැපයීම” ක්ෂුද්‍ර මූල්‍ය යන්නෙන් අදහස් කෙරෙන බව ආසියානු සංවර්ධන බැංකුව අර්ථ දක්වයි. මෙලෙස ක්ෂුද්‍ර මූල්‍ය සම්බන්ධයෙන් විවිධ අර්ථකථන පවතින අතර පොදුවේ ගත් කළ මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රවේශ හැකියාවක් නැති අඩු ආදායම්ලාභීන් වෙත මුල්‍ය සේවා එනම්, ණය, ඉතිරිකිරීම්, රක්ෂණ හා ඒ හා බැඳුනු අනෙකුත් මූල්‍ය සේවා පහසුකම් සැපයීම මෙයින් අදහස් වේ.

### යහපත් ක්ෂුද්‍ර මූල්‍ය පරිචයන්හි වැදගත්කම

දිළිඳුකම පිටු දැකීමේ ප්‍රධාන උපාය මාර්ගයක් වශයෙන් ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරයට වැදගත් කාර්ය භාරයක් ඉටු කළ හැකි බව ජාත්‍යන්තරව පිළිගෙන ඇත. විධිමත් ආකාර මූල්‍ය පහසුකම්, දැරිය හැකි මිලකට ලබා ගැනීමට ඉඩ සැලැස්වීම තුළින් අඩු ආදායම් ලාභීන්ගේ ආදායම් ඉහළ නැංවීමෙන් ජීවන තත්ත්වය නංවාලීමටත්, එතුළින් සමස්ථ ආර්ථික ක්‍රියාකාරිත්වය හා කාර්යක්ෂමතාව, සමාජ ශුභ සිද්ධිය, ඒකාබද්ධතාව වැඩිකර ගැනීමටත් ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරවලට ඉහළ දායකත්වයක් සැපයිය හැකි ය. මෙම අරමුණු ඉටු කර ගැනීමට නම් ප්‍රමාණාත්මක ව්‍යාප්තියක් පවතින ස්ථාවර හා කාර්යක්ෂම ක්ෂුද්‍ර මූල්‍ය ආයතන පද්ධතියක් පැවතිය යුතු ය. එවන් ශක්තිමත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන පද්ධතියක් බිහි වීමට එම ආයතන යහපත් ක්ෂුද්‍ර මූල්‍ය පරිචයන් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය ය.

### යහපත් ක්ෂුද්‍ර මූල්‍ය පරිචයන්

ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අවධානය යොමු කළ යුතු යහපත් පරිචයන් කවරේද යන්න විවිධ රටවල ඒ සම්බන්ධයෙන් පවත්නා විචක්ෂණ නියාමන, විධාන, රීතී හා ප්‍රතිපත්ති ඇසුරෙන් සලකා බැලීමට මෙම සටහන තුළින් අපේක්ෂිත ය.

මෙහි දී යහපත් ක්ෂුද්‍ර මූල්‍ය පරිචයන් අදාළ වන ක්ෂේත්‍ර හා මූලික වශයෙන් ඉන් ශුභ සිද්ධි සැලසෙන්නේ කවරකුටද යන්න මත පහත දැක්වෙන අයුරින් වර්ගීකරණය කළ හැකි ය.

එසේ වුවද, ඉහත වර්ගීකරණයේ දී මූලික වශයෙන් සැපයුම්කරුගේ ශුභ සිද්ධිය තහවුරු කෙරෙන පරිචයන් වක්‍රාකාරව පාරිභෝගිකයාගේ ශුභ සිද්ධියට ද දායක වන අතර පාරිභෝගිකයාගේ ශුභ සිද්ධිය තහවුරු කෙරෙන ක්ෂුද්‍ර මූල්‍ය පරිචයන් වක්‍රාකාරව සැපයුම්කරුගේ ශුභ සිද්ධියට ද හේතුවන බවක් පැහැදිලි වේ. උදා: කාර්ය මණ්ඩල කාර්යක්ෂමතාව

| පරිචයේ ප්‍රතිලාභය හිමි වන අය | යහපත් ක්ෂුද්‍ර මූල්‍ය පරිචය අදාළ වන ක්ෂේත්‍රය |
|---|---|
| ක්ෂුද්‍ර මූල්‍ය සේවා සැපයුම්කරු | ▪ කාර්ය මණ්ඩල කාර්යක්ෂමතාව වර්ධනය කිරීම<br>▪ අවදානම් කළමනාකරණය |
| ක්ෂුද්‍ර මූල්‍ය සේවා පාරිභෝගිකයා | ▪ මූල්‍ය සේවාවල ගුණාත්මකභාවය වැඩි කරලීම හා කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුතු සේවාවක් ලබා දීම |
| ක්ෂුද්‍ර මූල්‍ය සේවා සැපයුම්කරු හා පාරිභෝගිකයා යන දෙදෙනාම | ▪ පොලී අනුපාත තීරණය කිරීම, ණය නිදහස් කිරීම හා අය කර ගැනීම<br>▪ ආචාර ධර්ම පද්ධති පවත්වාගෙන යෑම |

වර්ධනය කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්ෂුද්‍ර මූල්‍ය පරිචයන් වඩා ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් ලබා දීම තුළින් ක්ෂුද්‍ර මූල්‍ය සේවා පාරිභෝගිකයාගේ ද ශුභ සිද්ධිය සලසයි. අනෙක් අතට පාරිභෝගිකයාගේ ශුභ සිද්ධිය මූලික කොට ගත් මූල්‍ය සේවාවල ගුණාත්මකභාවය වැඩි කරලීම සඳහා අනුගමනය කළ හැකි ක්ෂුද්‍ර මූල්‍ය පරිචයන්, ගනුදෙනුකරුවන්ගේ විශ්වසනීයත්වය දිනා ගැනීමට හැකියාව ඇති කිරීමෙන් ක්ෂුද්‍ර මූල්‍ය සේවා සැපයුම්කරුට යහපත සලසයි.

එබැවින්, ක්ෂුද්‍ර මූල්‍ය පරිචයන් අදාළ වන ක්ෂේත්‍රය ඔස්සේ ඒ ඒ අංශ වඩාත් ඵලදායි කර ගැනීම පිණිස අනුගමනය කළ හැකි යහපත් පරිචයන් කවරේද යන්න විමසා බලනු වටී. එහිදී පහත කරුණු යහපත් ක්ෂුද්‍ර මූල්‍ය පරිචයන් වශයෙන් හඳුනා ගත හැකිය.

**පොලී අනුපාත තීරණය කිරීම, ණය නිදහස් කිරීම හා අය කර ගැනීම**

ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල ප්‍රධානතම ව්‍යාපාරික කටයුත්තක් වන ණය දීම සම්බන්ධයෙන් එම ආයතනවලට අනුගමනය කළ හැකි යහපත් පරිචයන් ගණනාවකි. එනම්:

- අදාළ සියලු සාධක සැලකිල්ලට ගනිමින් ණය සහ අත්තිකාරම් සඳහා අය කළ යුතු පොලී අනුපාත තීරණය කිරීමේ ක්‍රමවේදයක් සැකසීම.

බොහෝ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන තමන් සපයන ණය සඳහා අධික පොලියක් අය කරයි. අරමුදල් සපයා ගැනීමට දැරිය යුතු අධික පිරිවැය, ඉහළ මෙහෙයුම් පිරිවැය, අවදානම් වාරික (Margin & Risk Premium) ආදී සාධක අධි පොලී අය කිරීමට හේතු වී ඇත. ඒ සියලු සාධක සැලකිල්ලට ගනිමින් පොලී අනුපාත තීරණය කිරීමේ ක්‍රමවේදයක් සැකසීම තුළින් ණය ගැතියන්ට පීඩාවක් නොවන අයුරින් හා ආයතනයට අලාභයක් නොවන අයුරින් තුලනාත්මකව සලකා බලා පොලී අනුපාත තීරණය කිරීමට හැකිවනු ඇත. එසේම එකී තීරණාත්මක සාධක සඳහා යෙදවිය යුතු පිරිවැය අවම කර ගැනීමේ උපාය මාර්ග සකසා ගැනීමට ද එමඟින් පිටුබලයක් ලැබේ.

- ණය ගැතියන්ට තමා ගෙවිය යුතු පොලී අනුපාතය නිශ්චිතව දැන ගැනීම පිණිස එම පොලී අනුපාත වාර්ෂික අනුපාත වශයෙන් දැක්වීම මෙන් ම එක් එක් වර්ගයේ ණය සඳහා අය කරන පොලී අනුපාත මහජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රකාශයට පත් කිරීම.
- ණය අයකර ගැනීමේ සුදුසු ක්‍රමවේද සැකසීම හා ඒ පිළිබඳ විනිවිද භාවයකින් යුතුව ක්‍රියා කිරීම. මෙමගින් ගනුදෙනුකරුවන්ගේ යහපත තහවුරු කෙරෙන අතර, ණය අය කිරීම සඳහා ආක්‍රමණශීලී ප්‍රතිපත්ති අනුගමනය කිරීම සම්බන්ධයෙන් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වෙත එල්ල වන චෝදනා මෙවන් ප්‍රතිපත්තියක් තුළින් අවම කරගත හැකි වනු ඇත.
- අනිවාර්ය ඉතුරුම් හෝ රක්ෂණ වාරික ණය මුදලින් කපා නොගැනීම.
- ණය ලබා ගැනීම සඳහා කරන අනිවාර්ය ඉතුරුම් සම්බන්ධයෙන් අවම පොලී අනුපාත තීරණය කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.
- ණය සඳහා වන පොලී අනුපාත හීනවන ශේෂයට ගණනය කිරීම.
- කාර්යක්ෂමතාව නංවාලීම තුළින් ණය සඳහා අය කරන පොලී අනුපාත අඩු කරලීමට පියවර ගැනීම.
- ගනුදෙනු පිරිවැය අවම කර ගැනීමේ ක්‍රමෝපාය සකසා ගැනීම.

ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයක් සුළු පරිමාණ ණය දීම් විශාල ප්‍රමාණයක් කරන හෙයින් මේ සම්බන්ධ විශේෂ අවධානයක් යොමු කිරීමෙන් වඩා සහනශීලී පොලී අනුපාත මත පාරිභෝගිකයන් වෙත ණය නිදහස් කිරීමට ක්ෂුද්‍ර මූල්‍ය සේවා සැපයුම්කරුට හැකියාවක් ලැබෙනු ඇත. එ මෙන් ම, සාපේක්ෂ ව අඩු පොලියකට ණය දීම, නැවත ණය ගෙවීමට ණයකරුවන් පොළඹවන බැවින් එ මඟින් ණය අය කර ගැනීම් ඉහළ දමා ගත හැක.

**කාර්ය මණ්ඩල කාර්යක්ෂමතාව වර්ධනය කිරීම**

- ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල කාර්යක්ෂමතාව නංවාලීම අරමුණු කොට ගත් කාර්යඵල ප්‍රමිති සැකසීම, වැඩි දියුණු කිරීම හා භාවිතා කිරීම.

මෙම කාර්යවල ප්‍රමිති මූල්‍ය දර්ශක හා මිනුම් ලකුණු (Benchmark) වලට පමණක් සීමා නොවී ඊට ගනුදෙනුකරුවන් හා ප්‍රජාව වෙත ඇති බලපෑම දක්වන දර්ශක ද ඇතුළත් කිරීමෙන් වඩාත් යහපත් පරිචයන් සකසා ගත හැකි වනු ඇත.

- සුදුසු වැඩමුළු තුළින් කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ශක්‍යතා වර්ධනයට කටයුතු කිරීම.
- ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල මූල්‍ය කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය විධිමත් කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රමවේද සකසා ගැනීම් සහ සේවක කුසලතාව වැඩි කර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර අනුගමනය කිරීම.

බොහොමයක් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ලාභය පරමාර්ථ කොට නොගත් සමාජ සුභ සාධන ආයතන ලෙස ආරම්භව ක්‍රියාත්මක වන ඒවා හෙයින් එම ආයතනවල මූල්‍ය කළමනාකරණය හා අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් ඇති හැකියා දුර්වල මට්ටමක පවතී. එසේම ඒවායේ බාහිර අංශවලට හා මහජනතාවට තොරතුරු සැපයීමේ ක්‍රමවේද ක්ෂුද්‍ර මූල්‍ය සේවාවල සංකීර්ණතා හැසිරවීමට සුදුසු අයුරින් නිර්මාණය කර නැත. එසේ හෙයින් මෙම පරිචයන් ඇති කර ගැනීමට විශේෂ අවධානයක් යොමු කිරීම වැදගත් වේ.

**අවදානම් කළමනාකරණය**

- දෛනික ව්‍යාපාරික කටයුතු සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම හා මහජන විශ්වාසය රඳවා ගැනීම සඳහා

ප්‍රමාණවත් ද්‍රවශීල වත්කම් පවත්වා ගැනීම.

- අක්‍රීය ණය වර්ගීකරණය, බොල් සහ අඩමාන ණය සඳහා මුදල් ප්‍රතිපාදනය කිරීම.
- එක් ණය කරුවකුට දිය හැකි ණය පහසුකම් පිළිබඳ උපරිම සීමාවලට අනුකූල වීම.
- ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයේ අධ්‍යක්ෂවරුන් වෙත සපයන ණය පහසුකම් පිළිබඳ සීමා පැනවීම.
- කාර්යක්ෂම සහ නිවැරදි ලෙස තොරතුරු රැස් කිරීමේ හා වාර්තා කිරීමේ ක්‍රමෝපාය සකසා ගැනීම. මේ සඳහා වර්තමානයේ දී තොරතුරු තාක්ෂණය පහසුවෙන් ම යොදාගත හැකිය.

**මූල්‍ය සේවාවල ගුණාත්මක භාවය වැඩි කරලීම හා කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුතු සේවාවක් ලබා දීම**

- සපයන සේවාවල ප්‍රධාන ලක්ෂණ පිළිබඳ සරල බසින් ලියන ලද විස්තර පත්‍රිකා එම සේවාව ලබා ගැනීමට අදහස් කරන ගනුදෙනු කරුවන්ට ලබා දීම.
- අවශ්‍ය විට සපයන සේවා පිළිබඳ ප්‍රමාණවත් පැහැදිලි කිරීම් සිදු කිරීම.
- සේවා පිළිබඳ සියලුම වෙළඳ දැන්වීම් සත්‍ය තොරතුරු අඩංගු වන සහ මහජනතාව නොමග යවන ආකාරයේ තොරතුරු ඇතුළත් නොවන පරිදි සැකසීමට වග බලා ගැනීම.
- සේවා පිළිබඳ පළ කළ දැන්වීම් සම්බන්ධව වැඩිමනත් තොරතුරු/පැහැදිලි කිරීම් (ගාස්තු හා පොලී අනුපාත ආදිය) ඉල්ලා සිටි විට ලබා දීම.
- ක්ෂුද්‍ර මූල්‍ය සේවාවල විස්තර, නියමයන් හා කොන්දේසි ගනුදෙනුකරුවන්ට ලබා දීම, පැහැදිලි කර දීම හා එම සේවා සම්බන්ධයෙන් එකඟ වූ නියමයන් සහ කොන්දේසිවල වෙනසක් සිදු කරන්නේ නම් ඊට ප්‍රථම යෝග්‍ය ආකාරයකින් ගනුදෙනුකරුවන්ට ඒ පිළිබඳව දැනුම් දීම.

**ආචාර ධර්ම පද්ධති පවත්වා ගෙන යාම**

- ආයතනික යහපාලනය ඇතිකරලීම සඳහා සුදුසු ආචාර ධර්ම සංග්‍රහයක් (Code of Ethics) සකසා ගැනීම. මෙමගින් අකාර්යක්ෂම අධ්‍යක්ෂ මණ්ඩල, සම්බන්ධිත පාර්ශ්වයන්ට ණය දීම් ආදී ගැටලු මග හරවා ගත හැකිවනු ඇත.
- ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල නියෝජිතයන්ගෙන් ගනුදෙනුකරුවන්ට වන හිරිහැර වැළැක්වීම සඳහා සුදුසු ප්‍රතිපත්ති සැකසීම.
- මෙහි දී සිය නියෝජිතයන්ට ඒ සම්බන්ධයෙන් ආචාර ධර්ම සංග්‍රහයක් පැනවීම හා එම නියෝජිතයින්ගේ විස්තර හා ආචාර ධර්ම සංග්‍රහයේ අන්තර්ගතය ගනුදෙනුකරුවන්ට දැන ගැනීමට ඉඩ සැලසීමට ක්‍රියා කළ හැකිය.
- ගනුදෙනුකරුවන් හා ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය අතර ආරවුල් ඉක්මනින් හා ඵලදායි ලෙස නිරාකරණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.
- මේ සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය වෙත ලිඛිතව මෙන්ම වාචිකව පැමිණිලි කිරීමට පහසුකම් සැපයීම, කෙටි කාලයක් තුළ පැමිණිලි නිරාකරණය කිරීම, අත් වැරදීමකින් අය කළ ගාස්තු නොපමාව අවලංගු කිරීම ආදිය ඇතුළත් වීම උචිතය.

යහපත් ක්ෂුද්‍ර මූල්‍ය පරිචයන් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ දී ගනුදෙනුකරුවන් වෙත ඇති වගකීමද අමතක නොකළ යුතු ය. විශේෂයෙන් ම, ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්බන්ධයෙන් පැන නගින ගැටලුවක් වන්නේ ගනුදෙනුකරුවන් තමන්ට දැරිය හැකි ණය ආපසු ගෙවීමේ සීමාව ඉක්මවමින් ආයතන කීපයකින්ම ණය ලබා ගැනීමයි. මෙවන් ක්‍රියාවලින් ගනුදෙනුකරුවන් ද වැළකිය යුතු ය.

ගනුදෙනුකරුවන් සිය ගාස්තු හා ණය වාරික නියමිත කාලය තුළ ගෙවීම තුළින් ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය සමඟ යහපත් සම්බන්ධතාවක් පවත්වා ගත යුතු ය. එසේම ගනුදෙනුකරු සිය ලිපිනය හා අනෙකුත් සම්බන්ධීකරණ තොරතුරුවල වෙනසක් සිදු වුවහොත් ඒ පිළිබඳ ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය දැනුම්වත් කළ යුතු ය.

යහපත් ක්ෂුද්‍ර මූල්‍ය පරිචයන් අනුගමනය කිරීම තුළින් මනා අවදානම් කළමනාකරණයක් සහිත ඵලදායි ආයතනික ව්‍යුහයක් ඇතිකර ගැනීමට, තැන්පතුකරුවන්ට හා අනෙකුත් ගනුදෙනුකරුවන්ට ඇති අවදානම අවම කිරීමට, විනිවිද භාවයකින් යුතුව ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි සැලකිල්ලෙන් කටයුතු කිරීමට හා ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය දිනා ගැනීමට හැකිවනු ඇති අතර එමගින් රටේ ආර්ථිකයට උර දෙන කාර්යක්ෂම හා ප්‍රමාණාත්මක ව්‍යාප්තියක් ඇති ක්ෂුද්‍ර මූල්‍ය ආයතන පද්ධතියක් ද බිහිවනු ඇත.✪

**ආශ්‍රිත මූලාශ්‍ර**


1. Best Practices in Microfinance - Facilitating the provision of financial services to low income families - www.endpovertfoundation.org
2. Microfinance Best Practices - Tips for Lenders - www.crofinancegateway.org
3. Microfinance regulations for development: global experience - 2011 - Rahman Rushidan
4. The role of Central Banks in microfinance in Asia and the Pacific: country studies volume 2 - 2000 - Asian Development Bank
5. Toward an ADB Microfinance Development Strategy - 2000 - Asian Development Bank
6. Understanding microfinance - 2009 - Panda Debadutta Kumar

# සේවක අර්ථසාධක අරමුදල

# එදා, අද සහ හෙට

**උපාලි තිලකරත්න**

නියෝජ්‍ය අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව

සේවක අර්ථසාධක අරමුදල ශ්‍රී ලංකාවේ ඇති විශාලතම සමාජ ආරක්ෂණ ක්‍රමය යි. එය විශ්‍රාම වැටුප් හිමිකම් නොලබන පෞද්ගලික සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතුවූවන්ගේ විශ්‍රාම දිවියෙහි සුරක්ෂිතතාව අරමුණු කරගනිමින් ඊට අත්වැලක් වන්නට පිහිටුවන ලද්දේ ය. එය සේව්‍ය සේවක දෙපාර්ශ්වයේ ම අනිවාර්ය දායකත්වයෙන් යුත් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ක්‍රමයක් ලෙස පිහිටුවා ඇත. ඒ, 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ ය. එහෙත් ඊට දස වසරකටත් පෙර සර් අයිවර් ජෙනිංස් ගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද සමාජ සේවා කොමිසම 1947 දී අර්ථසාධක අරමුදලක් පිහිටුවිය යුතු යයි නිර්දේශ කර තිබුණත් එය ක්‍රියාවට නැංවී නොතිබිණි. කෙසේ වෙතත් 1958 දී අර්ථසාධක අරමුදලක් පිහිටුවීම පිළිබඳ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද්දේ එවකට නිවාස හා සමාජ සේවා අමාත්‍යවරයාව සිටි ටී.බී. ඉලංගරත්න මහතා විසිනි. මේ සම්බන්ධයෙන් 1958 නොවැම්බර් 21 දින නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ පළමු නියෝගය අනුව සේවක අර්ථසාධක අරමුදලට සේව්‍ය සේවක දෙපාර්ශ්වය විසින් සේවකයාගේ මාසික ඉපැයීම්වලින් පිළිවෙලින් සියයට 6ක් සහ 4ක් ලෙස මාසිකව දායක මුදල් ගෙවිය යුතු බවට නියම කෙරිනි.

විශ්‍රාම වැටුප් හිමිකම් නොලබන අති විශාල පිරිසකට ජීවිතයේ සැදෑ සමය අගහිඟකමින් තොරව ගත කිරීම සඳහා සේවාවසානයේ ප්‍රතිලාභ ලබාදෙන සේවක අර්ථසාධක අරමුදල, 1958 දෙසැම්බර් 01 දින සිට ආයතන 54 ක් විෂයෙහි බලාත්මක කිරීමෙන් පිහිටුවන ලදි. කෙසේ වෙතත් සේවක අර්ථසාධක අරමුදල් පිහිටුවීමේ අරමුණු පසුකාලීනව පනතට ගෙන එන ලද සංශෝධන සහ නියමයන් මඟින් තවදුරටත් පුළුල් වී තිබේ. ඒ අනුව,

(i) 1978 අංක 8 දරන පනත් සංශෝධනයෙන් සේව්‍යයා හා සේවකයා පිළිවෙලින් සේවකයාගේ මුළු ඉපැයීම්වලින් මාසිකව සියයට 9ක් සහ 6ක් ලෙස අරමුදලට දායක විය යුතු බවට නියම කර ඇත.

(ii) 1981 අංක 26 දරන පනත් සංශෝධනයට අනුව සේව්‍යයා හා සේවකයා පිළිවෙලින් මාසිකව අරමුදලට දායක විය යුතු අරමුදල සේවකයාගේ මුළු ඉපැයීම්වලින් සියයට 12ක් සහ 8ක් ලෙස නියම කර තිබේ. වර්තමානයේ අවම දායක මුදල ලෙස පවතින්නේ මෙම අනුපාතයයි.

(iii) 1988 අංක 42 දරන පනත් සංශෝධනයෙන් අර්ථසාධක අරමුදලේ සාමාජිකයාගේ ශේෂය ඇපයට තබා අනුමත බැංකුවකින් නිවාස ණයක් ලබාගැනීමට විධිවිධාන සැලසිනි.

(iv) 2012 අංක 2 දරන පනත් සංශෝධනයෙන් නිවාස කටයුත්තක් වෙනුවෙන් හෝ සාමාජිකයාගේ වෛද්‍ය ප්‍රතිකාර කටයුතු සඳහා හෝ තම කේවල ගිණුමේ පවතින ශේෂයෙන් සියයට 30 ක ප්‍රමාණයක් නිදහස් කිරීමට පහසුකම් සලසා තිබේ. මෙම පහසුකම ක්‍රියාත්මක කරවීමේ ක්‍රමවේදය මේ වන විට සැකසෙමින් පවතී.

මේ අනුව මෙම අරමුදලේ නිර්මාතෘවරුන්ගේ අරමුණ වඩා පුළුල් හා ශක්තිමත් පදනමකින් ක්‍රියාත්මක කරලීම පිණිස පසුගිය වසර 54 තුළ සාධනීය පියවර කිහිපයක් ගෙන ඇති බව පෙනේ.

**ද්විත්ව පරිපාලනය**

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතට අනුව පනත ක්‍රියාවේ යෙදවීම කම්කරු දෙපාර්තමේන්තුවට

පැවරී ඇත. ඒ අනුව අරමුදලේ පරිපාලන කටයුතු මෙහෙයවීම කම්කරු කොමසාරිස්වරයා ගේ වගකීමට යටත් වේ. එහිලා සේවායෝජකයන් හා සාමාජිකයන් ලියාපදිංචිය, පනතේ විධිවිධාන ප්‍රකාර කටයුතු සිදුවීම සහතික කරනු වස් විමර්ශන කටයුතුවල යෙදීම හා දායක මුදල් ගෙවීම් පැහැර හැරීම් සම්බන්ධයෙන් නෛතික පියවර ගැනීම, ප්‍රමාද ගෙවීම් මත සේවායෝජකයන්ගෙන් අධිභාර අයකිරීම, ප්‍රතිලාභ ගෙවීම සඳහා අයදුම්පත් භාරගැනීම හා ප්‍රතිලාභ නිදහස් කිරීමේ තීරණ ලිපි ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කිරීම, නිවාස ණය සඳහා කෙරෙන ණය අයදුම්පත් අනුමත කිරීම යනාදී කාර්ය රැසක් කම්කරු දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබයි.

පනතේ විධිවිධාන අනුව අරමුදලේ මූල්‍ය භාරකරු ශ්‍රී ලංකා මහ බැංකුව යි. සේවක අර්ථසාධක අරමුදල හා සම්බන්ධ කටයුතු රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉටුකරනු ලබන නියෝජිත කටයුතුවලින් එකකි. මේ සඳහා මහ බැංකුවෙහි සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව නමින් දෙපාර්තමේන්තුවක් පිහිටුවා ඇත. අරමුදලේ මූල්‍ය භාරකරු වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු රැසක නියැලෙයි. සාමාජිකයන්ගේ හා සේව්‍යයන්ගේ ගිණුම් පවත්වාගෙන යෑම, දායක මුදල් සහ දඩ මුදල් රැස්කිරීම, සුරක්ෂිත හා වඩාත් ඵලදායි අංශවල ආයෝජනය, ආයෝජනයෙන් ලැබෙන ආදායම භාරගෙන අරමුදලට බැර කිරීම, කම්කරු කොමසාරිස් සහතික කරන තැනැත්තන්ට ප්‍රතිලාභ ගෙවීම, වාර්ෂික පදනමින් අරමුදලේ සියළුම ලැබීම් හා ගෙවීම්, ආදායම් සහ වියදම්, වත්කම් හා බැරකම් හා සියළු ආයෝජනවල මුණත් වටිනාකම, ගැනුම් මිල හෝ වෙළෙඳපොළ වටිනාකම හෝ ඇතුළත් ගිණුම් වාර්තා සකස් කිරීම සහ ගිණුම් වර්ෂය අවසාන වී මාස තුනක් ගතවීමට පෙර එම වාර්තා විෂය භාර අමාත්‍යවරයාට භාරදීම යනාදිය මේ අතර වෙයි. අරමුදලේ ගිණුම් රජයේ විගණකාධිපති විසින් විගණනය කරනු ලබයි.

### අරමුදල් රැස්කිරීම සහ කේවල ගිණුම්ගත කිරීම

සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් ගෙවිය යුතු මුල්ම ආයතන ලැයිස්තුවට ආයතන 54 ක් ඇතුළත් විය. මෙම ආයතන 54 සඳහා පනත ක්‍රියාත්මක වන දින 1958 දෙසැම්බර් 1 ලෙස නියම කෙරී ඇත. 1958 නොවැම්බර් 21 දිනැති ගැසට් නිවේදනයේ පළමු නියෝගයෙහි මේ බව දැක්වේ. එම ගැසට් නිවේදනයේ ම 1959 ජනවාරි 01 දින සිට තවත් ආයතන 14 ක් සඳහා පනත බලාත්මක කර ඇත. මෙලෙස වරින්වර පනතින් ආවරණය විය යුතු ආයතන සංඛ්‍යාව නියම කරමින් පැමිණ 1970 වර්ෂයේ දී පැවැත්වූ 13 වැනි නියෝගයෙන් එක් සේවකයකු හෝ සේවයේ යොදවා ඇති ආයතනයක් වුවද සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු බවට නියම විය. මෙම තත්ත්වය පසුව විවිධ රෙගුලාසි හා නියමයන් අනුව තවදුරටත් පුළුල් කෙරිනි. පසුගිය වසර 10 තුළ සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් රැස්කිරීම පිළිබඳ තොරතුරු පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වන්නේ වසරක දී ලැබෙන දායක මුදල් බිලියනයක මට්ටමට පත්වීමට වසර 24 ක් ගත වී තිබෙන බවයි. 1981 වර්ෂයේ ලැබූ දායක මුදල රුපියල් මිලියන 1,089 ක් ලෙස වාර්තා වෙයි. මෙය 2012 වර්ෂයේ දී රුපියල් බිලියන 70.2 ක් බවට පත් වෙමින් වසර 20 ක් තුළ 60 ගුණයකින් ඉහළ ගියේ ය. මෙහි සාමාන්‍ය වර්ධනය සැලකුවහොත් එය වසර 5 කට වරක් දෙගුණයකට ආසන්න ප්‍රමාණයකින් වැඩිවන බව පෙනේ. මෙය වැටුප් තලයන්හි ඉහළ යෑම, සාමාජික සංඛ්‍යාව ඉහළ යෑම, නව සේව්‍යයන් ලියාපදිංචි වීම සහ අවම දායක මුදල් ප්‍රතිශතය ඉහළ යෑම යන කරුණු මත සිදු වූවකි.

**සේවක අර්ථසාධක අරමුදල එක්රැස් කළ දායක මුදල්**

| වසර | දායක මුදල් ලැබීම (රු.මි.) |
|---|---|
| 1975 | 216 |
| 1980 | 747 |
| 1985 | 1,930 |
| 1990 | 3,937 |
| 1995 | 8,154 |
| 2000 | 16,853 |
| 2005 | 27,315 |
| 2010 | 54,796 |
| 2011 | 61,879 |
| 2012(අ) | 70,171 |

**සේවක අර්ථසාධක අරමුදල් වාර්ෂික වාර්තාව - 2010**

(අ) තාවකාලික **ශ්‍රී ලංකා මහ බැංකුව**

2011 වර්ෂය අවසන් වන විට දායක මුදල්, පොලී සහ ආයෝජන ආදායම් සහිතව අරමුදලේ සමස්ත වටිනාකම රුපියල් බිලියන 1020 ක් විය. මෙම වටිනාකම ශ්‍රී ලංකාවේ විශාලතම සමාජ ආරක්ෂණ ක්‍රමය ලෙස එහි තත්ත්වය තවදුරටත් තහවුරු කරයි. සේවක අර්ථසාධක අරමුදලේ වත්කම සමස්ත වාණිජ බැංකු ක්‍රමයේ වත්කම් හා බැංකු නොවන මූල්‍ය ආයතන වත්කම යන දෙකෙහි එකතුවෙන් 1/3 ක ප්‍රමාණයකට සමාන ය. මාසික දායක මුදල් ගෙවන සාමාජිකයන් මිලියන 2.3 ක් වෙනුවෙන් රුපියල් බිලියන 4.5 ක මුදලක් මාසිකව සේවක අර්ථසාධක අරමුදල වෙත බැර වේ.

1959 වසරේ දී සේව්‍යයන් 6,400 ක් විසින් සේවකයන් 85,000 ක් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් එවා ඇත. 2012 අවසන් වන විට මෙම සංඛ්‍යාව සේව්‍යයන් 68,000 ක් හා සේවකයන් මිලියන 2.3 ක් දක්වා ඉහළ ගොස් තිබේ. ඒ අනුව 1959 දී රුපියල් මිලියන 12 ක් වූ වාර්ෂික දායක මුදල 2012 වසරේ දී රු. බිලියන 70.1 ක් දක්වා වර්ධනය වී ඇත. සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් එවනු ලබන මෙන් ම නො එවනු ලබන ගිණුම් නිසි පරිදි පවත්වාගෙන යෑමත්, වාර්ෂිකව

ප්‍රතිලාභ මුදල් ගෙවීම සඳහා කම්කරු කොමසාරිස්වරයාගේ නිර්දේශය ලබන සාමාජිකයන් වෙනුවෙන් ප්‍රතිලාභ ගෙවීමත් මෑතකාලීනව කැපී පෙනෙන ලෙස වර්ධනය වී තිබේ.

**සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම්**

| වසර | ප්‍රතිලාභ ගෙවීම් රුපියල් මිලියන |
|---|---|
| 1970 | 33 |
| 1975 | 89 |
| 1980 | 205 |
| 1985 | 524 |
| 1990 | 1,209 |
| 1995 | 2,700 |
| 2000 | 10,802 |
| 2005 | 16,990 |
| 2010 | 34,896 |
| 2011 | 47,311 |
| 2012(අ) | 48,712 |

(අ) තාවකාලික

**මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා**

අරමුදල් ආයෝජනයේ දී අවදානම් කළමනාකරණය සඳහා ප්‍රමාණවත් විචක්ෂණශීලී පියවර ගැනීම මඟින් අරමුදලේ සුරක්ෂිතතාව ආරක්ෂා කරනු වස් සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විශාල කාර්යභාරයක් ඉටුකරයි. තම සාමාජිකයින් වෙනුවෙන් දායක මුදල් රැස්කර, ඒවා නිසි පරිදි ගිණුම්ගත කර, විචක්ෂණශීලීව ආයෝජනය කර, ආයෝජන ආදායම් ගිණුම්වලට බැර කර සුරක්ෂිත ලෙස නැවත ප්‍රතිලාභීන් වෙත ලබාදීමේ කටයුතු පසුගිය කාලය පුරා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව කිසිදු ප්‍රමාදයකින් තොරව සිදුකර ඇත. 1999 වසරේ සිට සාමාජිකයන්ගේ ගිණුම්වලට බැර කරන දායක මුදල් පිළිබඳ විස්තර, වෙනත් විස්තර ද සමඟ අර්ධ වාර්ෂික ගිණුම් වාර්තාවක් ලෙසින් සාමාජිකයින්ට ලබාදීමට ද පියවර ගෙන තිබේ.

**කලට වේලාවට ප්‍රතිලාභ ගෙවීම**

සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ අවස්ථා 6 ක් යටතේ නිදහස් කිරීමට පනතින් හා පසුකාලීනව පනතට ගෙන එන ලද සංශෝධන මඟින් ඉඩකඩ සලසා ඇත.

1. වයස සම්පූර්ණ වීම මත (පිරිමි වයස අවුරුදු 55, ගැහැණු අවුරුදු 50).
2. සාමාජිකාවන් සේවයෙන් ඉවත් වී මාස 03 ක් ගතවීමට පෙර විවාහ වී ඇත්නම් හෝ විවාහ වී අවුරුදු 05 ක් ගතවීමට ප්‍රථම සේවයෙන් ඉවත් වී ඇත්නම්.
3. වෛද්‍ය හේතූන් මත (සදාකාලිකව නැවත සේවය කළ නොහැකි බවට වෛද්‍ය මණ්ඩලයක් සහතික කළ යුතුය).
4. ස්ථිර පදිංචිය සඳහා විදේශ ගතවීම.
5. විශ්‍රාම වැටුප් සහිත ස්ථිර පත්වීමක් ලැබීම.
6. රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය ව්‍යාපාර අෑවර කිරීමේ දී හෝ වසා දැමීමේ දී සහ ප්‍රසිද්ධ සමාගම් බවට පත්කිරීමේ දී හෝ රාජ්‍ය සංස්ථා විසුරුවා හැරීමේ දී සේවක අර්ථසාධක අරමුදල් නිදහස් කරන ලෙසට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබීම. මෙය 1992 වසරේ දී පනතට ගෙන එන ලද නව සංශෝධනයක් මඟින් ක්‍රියාත්මක විය.

**ප්‍රතිලාභ ගෙවීම පිළිබඳ සංඛ්‍යා තොරතුරු**

| වසර | ආපසු ගෙවීමේ වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|
| 1980 | 205 |
| 1990 | 1,209 |
| 1995 | 2,886 |
| 2000 | 10,802 |
| 2005 | 17,024 |
| 2006 | 17,308 |
| 2007 | 21,830 |
| 2008 | 25,931 |
| 2009 | 31,901 |
| 2010 | 34,896 |
| 2011 | 47,311 |
| 2012 | 48,712 |

**මූලාශ්‍රය: සේවක අර්ථසාධක අරමුදල**

මෑත වර්ෂවල දී ප්‍රතිලාභ ගෙවීම්වල සැලකිය යුතු වර්ධනයක් පෙන්වයි. එය ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය වැඩිවීමේ තත්ත්වය සමඟ සමපාත වේ. මෙම තත්ත්වය ඉදිරියේ දී තවදුරටත් ඉහළ යා හැකි යැයි අපේක්ෂා කළ හැකි ය.

**සේවක අර්ථසාධක අරමුදලෙහි නිවාස ණය වැඩසටහන**

පනත ආරම්භයේ, විශ්‍රාමික දිවිය සැනසිලිදායක මට්ටමට ගෙන ඒමේ පරමාර්ථය මූලික වුවත් පසුකාලීනව විශ්‍රාම

දිවියට පෙර සාමාජිකයන්ගේ නිවාස අවශ්‍යතා සපුරා ගැනීම සඳහා විධිවිධාන සැලසීම පිණිස 1988 අංක 52 දරන සේවක අර්ථසාධක අරමුදල් සංශෝධන පනත ඉදිරිපත් කරනු ලැබීය. මෙම සංශෝධනය මඟින් සාමාජිකයන්ට තම කේවල ගිණුමේ ඇති ශේෂය ඇපයට තබා ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, සමුපකාර ග්‍රාමීය බැංකුව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව යන බැංකුවකින් නිවාස කටයුත්තක් සඳහා ණයක් ලබාගැනීමට හිමිකම් ලැබිණි. මෙහි දී දැනටමත් දායක මුදල් එවනු ලබන සාමාජිකයන් වෙනුවෙන් තම ගිණුමේ ශේෂයෙන් 75% ක ප්‍රමාණයක් සහ දැනට දායක මුදල් නොඑවන සාමාජිකයින් සඳහා තම ගිණුමේ ශේෂයෙන් 50% ක ප්‍රමාණයකට සමාන ණය මුදලක් ලබාගැනීමට හිමිකමක් ලැබේ. මෙම වැඩසටහන යටතේ 1998 - 2011 කාලය තුළ සාමාජිකයන් 180,998 දෙනෙකුගේ නිවාස අවශ්‍යතා සඳහා රුපියල් බිලියන 36 ක මුදලක් ලබාදීමට හැකි වී තිබේ.

මෙම ණය ආපසු ගෙවීම් සම්පූර්ණ කළ පසු අදාළ බැංකු වෙතින් ගෙවීම් තහවුරු ලබාගෙන ගිණුම් යාවත්කාලීන කිරීම ද සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

**නිවාස ණය වැඩසටහන පිළිබඳ සංඛ්‍යා තොරතුරු**

| වසර | නිකුත් කළ ඇප සහතිකපත් සංඛ්‍යාව* | අනුමත කළ ණය ප්‍රමාණය (රුපියල් මිලියන) |
|---|---|---|
| 2000 | 12,938 | 1,648 |
| 2005 | 14,600 | 2,766 |
| 2010 | 13,848 | 4,512 |
| 2011 | 20,041 | 6,355 |

**මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා වාර්ෂික වාර්තාව - සේවක අර්ථසාධක අරමුදල**

* නිවාස ණයක් ලබාගැනීම සඳහා මූලික ලෙසම තම ගිණුමේ ශේෂය ඇප සුරැකුමක් ලෙස සටහන් කළ පසුව මෙම සහතිකය නිකුත් කරනු ලැබේ.

ඉහත දත්ත මඟින් පෙන්වන්නේ අරමුදලේ සාමාජිකයන්ගේ නිවාස අවශ්‍යතා සඳහා සේවක අර්ථසාධක අරමුදල් සැලකිය යුතු තරමේ අනුග්‍රහයක් දක්වා ඇති බවයි. පසුගිය වසර 5 තුළ නිවාස ණය ලබාදීම දෙගුණයකින් වර්ධනය වීම මෙහිලා කැපී පෙනෙන ලක්ෂණයකි. නිවාස ණය මුදලක් ඉල්ලුම් කිරීමේ සිට ණය මුදල් ලැබීම දක්වා ගතවන කාලය තවදුරටත් අඩුකර ගැනීමේ අභියෝගය සාර්ථකව ජය ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් විවිධ වැඩටසහන් ක්‍රියාත්මක කර තිබේ.

නිවාස ණය බෙදාහැරීමේ කටයුතු සාර්ථක ප්‍රගතියක් පෙන්නුව ද ණය ආපසු අය කිරීමේ ප්‍රතිශතය පිළිබඳව සතුටු විය හැකි මට්ටමක් නොමැත. මේ පිළිබඳ දත්ත පෙන්වන්නේ වාර්ෂිකව නිදහස් කරනු ලබන ණය මුදල් ප්‍රමාණයෙන් සියයට 33 කට ආසන්න වටිනාකමක් ගත් ණය ආපසු නොගෙවන සාමාජිකයන් වෙනුවෙන් ඔවුන්ගේ ගිණුම්වලින් අඩුකර අදාළ බැංකු වෙත යොමු කිරීමට සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවට සිදු වී ඇති බවයි. 2012 වසරේ දී මෙලෙස බැංකු වෙත ප්‍රතිපූරණය කරන ලද මුළු මුදල රුපියල් බිලියන 2 කි. නිවාස ණය වැඩසටහනට සහභාගී වන බැංකුවල ඉහළ කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වා ණය ආපසු අය කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර රාශියක් පසුගිය වසර තුළ ක්‍රියාවට නංවා තිබේ. එසේ ම ග්‍රාමීය ප්‍රදේශවල මෙම නිවාස ණය වැඩසටහන පුළුල් කිරීම සඳහා සමුපකාර බැංකු කළමනාකාරිත්වය දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ද නිවාස ණය වැඩසටහන පුළුල් කිරීමට ගනු ලැබ ඇති ක්‍රියාමාර්ගයකි.

නිවාස ණය වැඩසටහනේ අවශ්‍යතාව පිළිගැනීමත්, ඉහළ ණය පැහැර හැරීමේ ප්‍රතිශතයක් වාර්තාවීමත් සැලකිල්ලට ගනිමින් 2012 වර්ෂයේ දී පනතට ගෙන එනු ලැබූ 2012 අංක 2 දරන සේවක අර්ථසාධක අරමුදල් සංශෝධන පනතට අනුව නිවාස කටයුත්තක් හෝ සාමාජිකයන්ගේ තෝරාගත් වෛද්‍ය කටයුතු සඳහා හෝ ඔවුන්ගේ ගිණුමේ ශේෂයෙන් සියයට 30 ක ප්‍රමාණයක් නිදහස් කිරීමට ඉඩකඩ විවෘත වී තිබේ.

**ආයෝජන හා පොලී ගෙවීම්**

සේවක අර්ථසාධක අරමුදල ක්‍රමයෙන් විශාලවත්ම සාමාජිකත්වය සඳහා ප්‍රමාණවත් ප්‍රතිලාභ ලැබෙන පරිදි අරමුදල් ආයෝජනය කිරීමට සුදුසු පියවර ගෙන ඇත. ඒ අනුව, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අරමුදල් ආයෝජනය පිළිබඳ අනුමත ප්‍රතිපත්තීන් අනුගමනය කරමින් 2012 වසර අවසානය වන විට රුපියල් බිලියන 1,106 ක් ආයෝජනය කර ඇත. අරමුදලේ සුරක්ෂිතතාව තහවුරුකර ගනිමින් සහ ප්‍රතිලාභ ගෙවීම් සිදුකිරීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පවත්වා ගනිමින් සාමාජිකයන් වෙත දිගුකාලීන ධන මූර්ත ප්‍රතිලාභයක් ලබාදීම ඉලක්ක කොටගත් අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තිය සඵලදායීව ක්‍රියාත්මක කර තිබේ. ඒ අනුව 2012 වසරෙහි ආයෝජනවලින් සියයට 91.5 ක් රජයේ

සුරැකුම් පත්වල ද සියයට 5.4 ක් ව්‍යාපාර කොටස්වල ද සියයට 0.7 ක ප්‍රමාණයක් සාංගමික ණයකරවල ද ආයෝජනය කර තිබුණි. සියයට 0.3 ක ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම්වල කරන ලද ආයෝජන විය. එසේම 2011 වසර අවසන් වන විට එම වර්ෂයෙහි සමස්ත ආයෝජන ආදායම රුපියල් බිලියන 121 ක් ලෙස වාර්තා වන අතර, පනතට අනුව කළ යුතු මෙහෙයුම් වියදම් දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 1 කට වඩා (0.78) අඩු මට්ටමක පවත්වා ගනිමින් සාමාජිකයන්ට උපරිම ප්‍රතිලාභයක් ලබාදීමට ක්‍රියාකර තිබේ. සමස්තයක් ලෙස 2012 වසර තුළ සාමාජිකත්වය අතර බෙදා හැර ඇති ශුද්ධ ආදායම රුපියල් බිලියන 111.8 වූ අතර එය සමස්ත ආයෝජන ආදායමින් සියයට 92.1ක අගයකි.

ආරක්ෂා කිරීම සඳහා වන පොලී අනුපාතයක් වාර්ෂික පදනමින් ගෙවිය යුතු ය. පසුගිය වසර කිහිපය තුළ විශේෂයෙන් ම 2009, 2010, 2011 හා 2012 යන වර්ෂවල උද්ධමන අනුපාතය ඉක්මවන ඉහළ පොලී අනුපාතයක් ලබාදීමට සමත් වීම තුළ ධන මූර්ත පොලියක් සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභීන් වෙත ගෙවීමට අරමුදල් කළමනාකරුවන් සමත් වුව ද එය දිගට ම පවත්වා ගැනීම විසඳා ගත යුතු අභියෝගයකි.

- **සාමාජික ප්‍රතිලාභ මුදල (මූල්‍ය වටිනාකම) ඉහළ නැංවීම**

අරමුදලේ මූර්ත වටිනාකම පවත්වාගෙන යාමේ අභියෝගය මෙන් ම එකවර ලැබෙන මුදලෙ හි ප්‍රමාණය සාමාජිකයාගේ ඉදිරි ජීවිත කාලය ගෙවා දැමීම සඳහා සෑහේද යන්න

**ආයෝජන කළඹ**

| ආයෝජන වර්ගය | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | **වටිනාකම** | **දායකත්වය %** | **වටිනාකම** | **දායකත්වය %** |
| භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් | 874.6 | 88.7 | 1012.1 | 91.5 |
| රජයේ රුපියල් ණය | 23.1 | 2.3 | 23.1 | 2.1 |
| සාංගමික ණයකර | 9.2 | 1.0 | 8.0 | 0.7 |
| සමාගම් කොටස් | 75.9 | 7.7 | 59.2 | 5.4 |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් | 2.8 | 0.3 | 3.1 | 0.3 |
| **එකතුව** | **985.6** | **100.0** | **1105.5** | **100.0** |

**මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව 2012**

**ආයෝජන කළඹ**

**අභියෝග**

- **අරමුදලේ මූර්ත වටිනාකම ආරක්ෂා කිරීම**

වයස්ගත වීම හේතුවෙන් තවදුරටත් වැඩ කළ නොහැකිව විශ්‍රාම ලැබූ පසු අගහිඟයකින් තොරව ජීවත්වීම සඳහා එකවර ප්‍රතිලාභ මුදලක් ලබාදීම මූලික අරමුණ කරගත් සේවක අර්ථසාධක අරමුදල් තුළින් ලබා දෙනු ලබන ප්‍රතිලාභය ඔහුගේ /ඇයගේ ඉදිරි දිවිය අපේක්ෂිත අයුරින් ගෙවීමට ප්‍රමාණවත් වේ ද යන ගැටලුව අප හමුවේ තිබේ. විශේෂයෙන් ම මෙහි එක් පැතිකඩක් වන්නේ ලැබෙන මුදලෙහි මූර්ත වටිනාකම ඉදිරි කාලය වෙනුවෙන් ආරක්ෂා කර ගන්නේ කෙසේද යන්න ය. ඒ සඳහා ආර්ථිකයේ වාර්ෂික සාමාන්‍ය උද්ධමන වේගය සමඟ සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ මුදල් මූර්ත වටිනාකම

ගැටලුවේ අනෙක් පැතිකඩයි. 2012 වසර වන විට අපගේ ආයු අපේක්ෂාව වසර 75.1 ක් විය. මේ අනුව අවුරුදු 55 දී එකවර මුදලක් ලබාගන්නා සාමාජිකයා වසර 20 ක් ද වසර 50 දී එකවර ප්‍රතිලාභ ලබාගන්නා සාමාජිකාව වසර 25 ක් ද මෙම ප්‍රතිලාභයෙන් ජීවත් විය යුතුය. මෙය සැබවින් ම අභියෝගකාරී ය. අරමුදලේ භාරකරුවන් විසින් එක්කෝ මෙම අරමුදල කොටස් වශයෙන් ඉදිරි වසර කිහිපය තුළ සාමාජිකයන් වෙත නිදහස් කිරීමේ ක්‍රමවේදයක් හෝ නැතහොත් විකල්ප ක්‍රමයකින් ප්‍රතිලාභ ප්‍රමාණය වැඩි කිරීම හෝ කළ යුතුව පවතී. මේ සඳහා සාමාජිකත්වයේ වාර්ෂිකව ඉහළ යන පොලී ආදායම එකතු වීම සහ ඒ සඳහා වැල් පොලී ලැබීමත් තුළින් අරමුදලේ සිදුවන ස්වාභාවික වර්ධනය ප්‍රමාණවත් ද යන්න ගැටලු සහගත ය.

තමන් ගේ සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ මුදල් ප්‍රයෝජනයට ගන්නා ආකාරය පිළිබඳ නිශ්චිත තොරතුරු

**සාමාජික ගිණුම් ශේෂ මත ගෙවන ලද පොලී අනුපාත**

| වසර | ගෙවන ලද පොලී අනුපාතය (%) |
|---|---|
| 1980 | 8.5 |
| 1985 | 12.5 |
| 1990 | 11.5 |
| 1995 | 12.75 |
| 2000 | 11.50 |
| 2005 | 9.00 |
| 2006 | 10.10 |
| 2007 | 11.20 |
| 2008 | 13.20 |
| 2009 | 13.75 |
| 2010 | 12.50 |
| 2011 | 11.50 |
| 2012(අ) | 11.50 |

(අ) තාවකාලික

**මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2012**
**සේවක අර්ථසාධක අරමුදල් වාර්ෂික වාර්තාව 2010**

වාර්තා නොවුවත් සත්‍ය ලෙස ම සාමාජිකයන් තමන් ලබා ගන්නා අරමුදලේ ප්‍රතිලාභ ඉදිරි ජීවිතය සැපවත් කර ගැනීම සඳහා අරපරිස්සමින් පරිහරණය කරන්නේ ද යන ගැටලුව අප හමුවේ තිබේ. මේ සම්බන්ධයෙන් සේවක අර්ථසාධක අරමුදලේ මීට පෙර සිටි කම්කරු කොමසාරිස් ඩබ්.ඩී.එස්. වැලිවත්ත මහතා "මෙහෙවර පියස සමරු කලාපය" ට ප්‍රකාශ කර ඇත්තේ පහත ආකාරයට ය. "මේ තත්ත්වය සමාජ සංරක්ෂණ දෘෂ්ටිකෝණයෙන් බැලූ විට යහපත් නොවන බව පෙනී යයි. සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභයෙන් තම ප්‍රතිලාභ සත්‍ය වශයෙන් ම වැය කෙරෙනුයේ තම සමාජ සංරක්ෂණය වෙනුවෙන් දැයි යන්න විමර්ශනය කළ යුතු ය. ප්‍රායෝගිකව දැකිය හැක්කේ සම්පූර්ණ නොවූ නිවාස අවශ්‍යතා ඉටුකර ගැනීමට, තම පවුලේ වෛද්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට හෝ දරුවන්ගේ අධ්‍යාපනය හා විවාහ කටයුතු වෙනුවෙන් මෙම මුදල වැය කරන බවයි". එනයින් බලන කළ වැඩිහිටි ජනගහනයේ දුගීභාවය පිළිබඳව අලුත් දෘෂ්ටියකින් බැලීමට අපහට සිදුවනු ඇත. මෙම ගැටලුව සඳහා ප්‍රායෝගික විසඳුමක අභියෝගය සේවක අර්ථසාධක අරමුදල් විසින් ජයගත යුතුව තිබේ.

සිංගප්පූරුව 1955 දී 'මධ්‍යම අර්ථසාධක අරමුදල' ආරම්භ කළ අතර, විවිධ සමාජ ආර්ථික වෙනස්කම්වලට අනුව සාර්ථකව හා නම්‍යශීලීව අරමුදලේ වෙනස්කම් ඇතිකරමින් අද වන විට ඉහත සඳහන් කළ ආකාරයේ අභියෝග සාර්ථකව ජය ගනිමින් ක්‍රියා කරන ආකාරය දක්නට ලැබෙයි. එයින් යම් ආදර්ශයක් අප රටට ද ලබා ගැනීමේ හැකියාව පවතින බව මෙහිලා සඳහන් කළ යුතුය. සිංගප්පූරු වැසියන්ගේ සාමාන්‍ය ආයු අපේක්ෂාව අවුරුදු 81 මට්ටමට ළඟා වී තිබේ. ඔවුන්ගේ 'මධ්‍යම අර්ථසාධක අරමුදලෙහි' පරමාර්ථ සපුරාගනු වස් වෙනත් බහුවිධ යෝජනා ද සමඟ සාමාජිකයාගේ ගිණුමෙහි වටිනාකමින් කොටසක් සේවකයාගේ කැමැත්ත පරිදි අවුරුදු 55 සිට ඉදිරි අවුරුදු 30 කාලයක් සඳහා මාසික දීමනාවක් බවට පරිවර්තනය කිරීමට 2009 වසරේ සිට ඉඩකඩ සලසා තිබේ. ස්ව කැමැත්තෙන් මේ සඳහා දායක වන සාමාජිකයන් දිරිගැන්වීමට එම ක්‍රමයට මාරුවන්නන්ගේ ගිණුම්වලට රජය ප්‍රසාද දීමනාවක් ලෙස සිංගප්පූරු ඩොලර් 4000 ක් ප්‍රේෂණය කරයි.

එමෙන් ම සිංගප්පූරු 'මධ්‍යම අර්ථසාධක අරමුදල' සඳහා දායක මුදල් රැස්කිරීම ද වයස් කාණ්ඩ අනුව වෙනස් අනුපාතවලින් සිදු කෙරේ. ඒ අනුව වයස අවුරුදු 18 - 50 අතර සාමාජිකයින්ගේ මාසික ඉපයීම්වලින් සියයට 36 ක් ද 50 -55 වයස් කාණ්ඩයට සියයට 30 ක් ද 55 -60 වයස් කාණ්ඩයට සියයට 21.5ක් ද 60 - 65 වයස් කාණ්ඩයට සියයට 14ක් ද 65 ට ඉහළ වයස් කාණ්ඩයට සියයට 11.5 ක් ලෙස ද අරමුදලට දායක විය යුතුය. මාසික දායක මුදල ද ගිණුම් තුනකට බැර කරන අතර, සාමාන්‍ය ගිණුම, විශේෂ ගිණුම සහ වෛද්‍ය සුරැකුම් ගිණුම ලෙස මුළු ගිණුම කොටස් තුනකි. සාමාජිකයා ජීවත්ව සිටින තෙක් වෛද්‍ය ප්‍රතිලාභ ගිණුමෙහි ප්‍රතිලාභ හිමි වන අතර, මෙම සියල්ලටම බාහිරව තෝරාගත් වෛද්‍ය රක්ෂණ ක්‍රම සඳහා සාමාජිකයාගේ වාරික ගෙවීම අදාළ අරමුදලේ මුදලින් සිදුකරයි. මෙම වැඩසටහන එම ආකාරයෙන් ම නොවුනත් අප රටට ගැලපෙන ආකාරයට ප්‍රායෝගික තලයකට ගෙන ඒමට ඇති හැකියාව සොයා බැලීමට මේ සුදුසු ම අවස්ථාවක් සේ සැලකිය හැකි ය.

- **අඩු වියදම් සහ කඩිනම් සාමාජික සේවා**

සාමාජිකයන්ට සහ සේව්‍යයන්ට තම ගැටලු ඉදිරිපත් කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවෙහි කාර්යාල සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව සමඟ නිතර සම්බන්ධ වීමට සිදුවේ. එහිදී කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් මට්ටමේ කාර්යාල 38 ක් පමණක් පිහිටා තිබීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටුවා තිබීමත් නිසා සාමාජිකයන් සහ සේව්‍යයන්ගේ විවිධ අවශ්‍යතා ඉටුකර ගැනීම වියදම්කාරී සහ අධික කාලයක් ගතවන කාර්යයක් බවට පත්වී තිබේ. මෙයට පිළියම් ලෙස ශ්‍රී ලංකා

මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව ඵලදායී පියවර රාශියක් ගෙන ඇත.

පවතින මෙහෙයුම් ක්‍රියාවලිය ලිපි, වාර්තා, ආකෘති පත්‍ර සහිත ලියකියවිලි මත පදනම් වූ (Paper Base) ක්‍රියාවලියක් වන අතර, නවීන තාක්ෂණය මත පදනම් වූ ඉලෙක්ට්‍රොනිකව දත්ත හුවමාරුවන ස්වයංක්‍රීය ක්‍රමයකට මාරුවීම සිදුවිය යුතු හදිසි කටයුත්තක් සේ සැලකිය හැකි ය. මෑතකාලීනව මෙම විෂයෙහි ලා ශ්‍රී ලංකා මහ බැංකුව මෙන් ම කම්කරු දෙපාර්තමේන්තුව ඉදිරි පියවර රාශියක් ගෙන තිබීම ද සැලකිය යුතු කරුණකි. 1999 වර්ෂය අවසන් වනවිට මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර මෙහෙයුම් ක්‍රියාවලිය පරිගණකගත කිරීමත් ශ්‍රී ලංකා මහ බැංකුව සහ දිස්ත්‍රික් කම්කරු කාර්යාල මෙම පරිගණක ජාලයට සම්බන්ධ කිරීමත් එතෙක් පැවති සාමාජික සේවාවල කාර්යක්ෂමතාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීමට හේතු වී තිබේ.

2011 වසර තුළ වඩා පහසුකම් සහිත 'මහජන කවුළුවක්' කොළඹ කොටුවේ සර් බාරොන් ජයතිලක මාවතේ විවෘත කිරීමත් සමඟ සාමාජික සේවා සැපැයීම යම් මට්ටමකින් පුළුල් වුවත් එකම වහලක් යටින් සියලු සේවා ලබාගැනීට තවමත් සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකයන්ට හැකියාවක් ලැබී නොමැත. නාරාහේන්පිට කම්කරු මහ ලේකම් කාර්යාලයට යාබද ව අභිනවයෙන් ඉදිකරනු ලබන මහල් 35 කින් යුත් 'මෙහෙවර පියස' ඉදි වූ පසු සේවක අර්ථසාධක අරමුදලේ සියළු සේවා එකම තැනකින් ලබාගත හැකි වන පරිදි සියළු ආයතන එම ගොඩනැගිල්ලට ගෙන ඒමට නියමිතව තිබේ.

විද්‍යුත් ක්‍රමයට පරිගණක තැටි මඟින් දායක මුදල් එවීමේ ක්‍රමයක් හඳුන්වාදීම 1999 වර්ෂයේ දී ආරම්භ කර ඇති අතර, පසුව මෙම ක්‍රමය විද්‍යුත් තැපෑල මඟින් තොරතුරු ගෙන්වා ගැනීම දක්වා ද 2011 වසරේ දී විද්‍යුත් මාධ්‍ය මඟින් දායක මුදල් රැස්කිරීමේ නියෝජිතයන් ලෙස වාණිජ බැංකු පත්කිරීමට ද පියවර ගෙන තිබේ. මෙහිදී මුලින් ම 2011 ඔක්තෝබර් මස සිට කොමර්ෂල් බැංකුවේ "paymaster" ක්‍රමය ද දෙවනුව 2012 දී ලංකා බැංකුවේ "i-net" ක්‍රමය ද හඳුන්වා දීම මඟින් ඔවුන්ගේ ශාඛා ජාලය තුළින් දායක මුදල් රැස්කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම දායක මුදල් ගෙවීම පිළිබඳ සේව්‍ය පක්ෂය ලැබූ පහසුවකි.

2012 අංක 2 දරන සේවක අර්ථසාධක අරමුදල් සංශෝධන පනත මඟින් සේවකයන් 50 කට වඩා සේවයෙහි යෙදෙන ආයතන තම දායක මුදල් තොරතුරු විද්‍යුත් තැපෑලෙන් එවීම අනිවාර්ය කර ඇති අතර, මේ ක්‍රමය ක්‍රියාත්මක වෙනවාත් සමඟ සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීම අඩු වියදම් කටයුත්තක් වනවා මෙන් ම කාර්යක්ෂමතාවය ද ඉහළ යනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2011 වාර්ෂික වාර්තාවේ සඳහන් වන පරිදි සාමාජික ගැටලු විසඳීම සඳහා ජංගම සේවා පැවැත්වීම උපාය මාර්ගික අරමුණක් බවට පත්කර තිබේ. මෙය සාමාජික සේවා සැපයීමේ ඵලදායී පියවරක් වීමට නම් පුළුල් පරාසයක සාමාජික සේවා, සමාජිකයාගේ හා සේව්‍යයාගේ අසලට ගෙන ගොස් ලබා දීමේ වැඩසටහන් ලෙස එය දියුණු විය යුතුය. සාමාජික සේවා අගනුවරින් බැහැර ප්‍රදේශවලට ගෙන යෑමේ අභියෝගය සාර්ථකව ජයග්‍රහණය කිරීම පිණිස ලියකියවිලි හා වාර්තා මත පදනම් වූ මෙහෙයුම් ක්‍රමවේදය අදාළ ලේඛන ඡායාස්ථ ගත කොට ජංගම සේවා හි දී පරිහරණය කිරීමට හැකි මට්ටමකට ගෙන ආ යුතුව තිබේ. වාර්තා ඡායා පිළිඹිබු ගත කිරීමේ ව්‍යාපෘතියක් අලුතින් ආරම්භ කර තිබීම මෙම කාර්යයේදී උපකාර වන සතුටුදායක පියවරකි.

යම් තැනැත්තෙකු, ආයතන කිහිපයක සේවය කර ඇති විට ඔහුට සේවක අර්ථසාධක අරමුදල් සාමාජික අංක කිහිපයක් හිමි වේ. ඒ අනුව එක් පුද්ගලයකු විෂයෙහි බහු අංක ක්‍රමයක් පැවතීම සහ එම අංකවල අදාළ තොරතුරු සෑම විටම නිවැරදි නොවීම (විශේෂයෙන් එකම නම විවිධ සේවා ස්ථානවල ඉංග්‍රීසි භාෂාවෙන් වෙනස්ව ලියාපදිංචි කර තිබීම වැනි) බොහෝ ගැටලු ඇති කරයි. මෙම තත්ත්වය අවම කිරීම සඳහා සෑම සාමාජිකයෙක් ම ඒකීය අංකයකින් සම්බන්ධ කිරීම අරමුණු කරගෙන 2007 වර්ෂයේ දී නැවත ලියාපදිංචිකිරීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදි. මෙහි දී ජාතික හැඳුනුම්පත් අංකය, සේවක අර්ථසාධක අරමුදලේ ඒකීය හඳුනා ගැනීමේ අංකය ලෙස නැවත ලියාපදිංචි කරන අතර, එමඟින් සාමාජිකයා මුල් කරගත් දත්ත පද්ධතියක් ඇති කර ගැනීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතියේ මුල් අදියර සාර්ථකව නිමා වී ඇති අතර, ඉදිරියේ දී ශ්‍රම වෙළෙඳපොළට පැමිණෙන නවකයින් මෙන් ම දැනට සිටින සේවකයන් අලුත් රැකියාවකට මාරු වීමේ දී ජාතික හැඳුනුම්පත් අංකයට අනුව ලියාපදිංචි කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබේ.

වර්තමානයේ බොහෝ ජනප්‍රිය ජංගම දුරකථන කෙටි පණිවුඩ සේවාව භාවිත කරමින් තම ගිණුමේ ශේෂය දැනගැනීම, ප්‍රතිලාභ අයදුම් කිරීමේ දී එහි තත්ත්වය දැනගැනීම වැනි තොරතුරු සඳහා අදාළ පහසුකම භාවිතයට සාමාජිකයන් වෙත අවස්ථාව ලබා දී තිබේ. මෙම සේවාව ලබාගැනීමට මුලින් ම අරමුදල සමඟ ලියාපදිංචි විය යුතු අතර, අදාළ සාමාජිකයාට ලැබෙන රහස්‍ය අංකය භාවිතයෙන් කෙටි පණිවුඩ සේවාවෙන් ගිණුමේ තොරතුරු ලබා ගතහැකි ය. එසේම, ප්‍රතිලාභ ලබාගැනීමේ අයදුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යැවීම පිළිබඳ තොරතුරු ද සාමාජිකයා වෙත කෙටි පණිවුඩයක් මඟින් දැනුම්වත් කිරීමට කම්කරු දෙපාර්තමේන්තුව විසින් පියවර ගෙන තිබේ.

මෙසේ ශ්‍රී ලංකාවේ විශාලතම හා පුළුල්තම සමාජ ආරක්ෂණ වැඩසටහන වන සේවක අර්ථසාධක අරමුදල අඛණ්ඩව වර්ධනය වෙමින් තම සාමාජිකත්වයට සහ අනෙකුත් හවුල්කරුවන් වෙත කාර්යක්ෂම සේවාවක් ලබාදීමට සමත් වී තිබේ. එය වෙනස්වන

(20 වෙනි පිටුවට...)

# ස්වෛරීත්ව ධන අරමුදල් (Sovereign Wealth Fund) පිළිබඳ හැඳින්වීමක්

**ඩබ්.එල්.ගුණසේන**

නියෝජ්‍ය අධ්‍යක්ෂ, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව

**ස්වෛරීත්ව ධන අරමුදලක් යනු කුමක්ද?**

කොටස්, බැඳුම්කර, දේපළ, අගනා ලෝහ වර්ග හෝ වෙනත් මූල්‍ය උපකරණ වැනි විවිධ මූල්‍ය වත්කම්වල ආයෝජනය කරන ලද කිසියම් රජයකට අයත් මූල්‍ය සංචිතයක් ස්වෛරීත්ව ධන අරමුදලක් වශයෙන් හැඳින්වේ. සාමාන්‍යයෙන් රජයට මෙම අරමුදල් ලැබෙන්නේ අයවැය අතිරික්තය තුළිනි. කිසියම් රටක් සතුව අයවැය අතිරික්තයක් ඇති අවස්ථාවකදී එය එම රටේ මහ බැංකුව සතුව තබා ගැනීම හෝ එරට ආර්ථිකය තුළට ගලා යාමට නොදී ආයෝජන මාර්ගයක් ලෙස එම මුදල් ස්වෛරීත්ව ධන අරමුදල්වල ආයෝජනය කිරීම හෝ සාමාන්‍ය ව්‍යවහාරයයි. ස්වෛරීත්ව ධන අරමුදල් ගෝලීය වශයෙන් ආයෝජනය කරනු ලබන අතර, බොහොමයක් ස්වෛරීත්ව ධන අරමුදල් විදේශ විනිමය වත්කම්වලින් මූල්‍යනය කරනු ලබයි.

ස්වෛරීත්ව ධන අරමුදල් ක්‍රියාත්මක කිරීමේ අභිප්‍රේරණ රටින් රටට වෙනස් වේ. උදාහරණයක් වශයෙන් එක්සත් අරාබි එමිරේට් රාජ්‍යය ඛනිජ තෙල් අපනයනය තුළින් උපදවා ගන්නා විශාල ආදායම් අතිරික්ත සංචිතය, ඛනිජ තෙල් ආශ්‍රිත අවදානමෙන් මුදා ගැනීම සඳහා එයින් කොටසක් ස්වෛරීත්ව ධන අරමුදල්වල අයෝජනය කිරීම දැක්විය හැකිය. බොහෝ රටවල් එම රටවල ලාභ වශයෙන් ඉදිරියට ගෙනෙන මුදල් ජාතික ආර්ථිකයේ සහ පුරවැසියන්ගේ ශුභසාධනය සඳහා ස්වෛරීත්ව අරමුදල්වල ආයෝජනය කරයි. විවිධ ආයෝජන මාර්ගවලට ධනය බෙදාහැරීම සහ මතු පරපුර වෙනුවෙන් ධනය ඉපිදවීම තුළින් රටේ ආර්ථිකය ස්ථාවර කිරීම ස්වෛරීත්ව ධන අරමුදලක මූලික කාර්යය වේ.

**ඉතිහාසය**

ප්‍රථම ස්වෛරීත්ව ධන අරමුදල වූයේ අතිරික්ත ඛනිජ තෙල් අරමුදල් ආයෝජනය සඳහා 1953 වර්ෂයේ පිහිටුවන ලද කුවේට් ආයෝජන අධිකාරිය (Kuwait Investment Authority) විසින් ඇති කරන ලද ස්වෛරීත්ව ධන අරමුදලයි. ඉන් වර්ෂ දෙකකට පසුව කිරිබති (Kiribati) රාජ්‍යය එහි ආදායම් සංචිත දැරීම සඳහා අරමුදලක් පිහිටුවන ලදී. පහත සඳහන් ප්‍රධාන අරමුදල් පිහිටුවන තුරු අලුත් ක්‍රියාකාරිත්වයන් (Activities) කිහිපයක් පමණක් සිදුවී ඇත.

- අබුඩාබි ආයෝජන අධිකාරිය (1976) (Abu Dhabi's Investment Authority)
- සිංගප්පූරු රාජ්‍ය ආයෝජන සංස්ථාව (1981) (Singapore Government Investment Corporation)
- නෝර්වේ රාජ්‍ය විශ්‍රාම අරමුදල (Norway's Government Pension Fund)

පසුගිය දශක කිහිපය තුළ ස්වෛරීත්ව ධන අරමුදල්වල විශාලත්වය හා සංඛ්‍යාව විශ්මය ජනක ලෙස ඉහළ ගියේය. 2012 වර්ෂය වනවිට ලොව පුරා පිහිටුවා තිබුණු ස්වෛරීත්ව ධන අරමුදල් සංඛ්‍යාව 50 ක් පමණ වූ අතර, ඒවායෙහි මුළු වටිනාකම ඇමෙරිකානු ඩොලර් ට්‍රිලියන 5 ඉක්මවිය.

**භාණ්ඩ සහ භාණ්ඩ නොවන ස්වෛරීත්ව ධන අරමුදල්**

ස්වෛරීත්ව ධන අරමුදල් භාණ්ඩ (Commodity) සහ භාණ්ඩ නොවන (Non Commodity) වශයෙන් දෙවර්ගයකට බෙදේ. මෙම දෙවර්ගයෙහි වෙනස වන්නේ අරමුදල මූල්‍යනය කරන ක්‍රමයයි.

භාණ්ඩ අපනයනය තුළින් ලැබෙන මුදල් උපයෝගී කරගෙන භාණ්ඩ ස්වෛරීත්ව ධන අරමුදල් මූල්‍යනය කරනු ලබයි. කිසියම් රටක අපනයන භාණ්ඩවල මිල ගණන් ඉහළ යන අවස්ථාවල එරට අපනයනවලට විශාල අතිරික්ත ආදායමක් ලැබේ. එමෙන්ම අපනයන භාණ්ඩවල මිල ගණන් පහළ යෑම, අපනයන මත යැපෙන ආර්ථිකයක අයවැය හිඟයකට මග පාදයි. මෙවැනි අවස්ථා වැලැක්වීමට ස්වෛරීත්ව අරමුදල් වෙනත් අංශවල ආයෝජනය කරමින් ආර්ථිකය ස්ථාවර කරනු ලබන සාධකයක් ලෙස ක්‍රියාකරයි.

2000 සහ 2012 අතර කාලය තුළ දී ගෑස් සහ ඛනිජ තෙල් මිල ඉහළ යාම හේතු කොට ගෙන භාණ්ඩ ස්වෛරීත්ව ධන අරමුදල්වල විශාල වර්ධනයක් ඇති විය. 2012 වනවිට භාණ්ඩ ස්වෛරීත්ව ධන අරමුදල්වල මුළු එකතුව ට්‍රිලියන 2.5 ඉක්මවිය.

ජංගම ගිණුමේ අතිරික්තය තුළින් ජනිත වන අමතර විදේශ විනිමය සංචිත උපයෝගී කරගෙන භාණ්ඩ නොවන ස්වෛරීත්ව ධන අරමුදල් මූල්‍යනය කරනු ලැබේ. 2012 වර්ෂය වනවිට භාණ්ඩ නොවන ස්වෛරීත්ව අරමුදල්වල මුළු එකතුව අමෙරිකානු ඩොලර් ට්‍රිලියන 2 ක් පමණ විය. මෙය ඊට වර්ෂ 3 කට පෙර මුළු ශේෂය මෙන් තුන් ගුණයකි. වර්තමානයේ බොහෝ ස්වෛරීත්ව ධන අරමුදල් මූල්‍යනය කරනු ලබන්නේ භාණ්ඩ අපනයනය තුළින් ලැබෙන අතිරික්ත මුදල්වලිනි. එසේ වුවද, 2015 වනවිට භාණ්ඩ නොවන ස්වෛරීත්ව ධන අරමුදල්වල අගය මුළු අරමුදල්වලින් සියයට 50 ඉක්මවනු ඇත.

**ස්වෛරීත්ව ධන අරමුදල් අයෝජනය කරනු ලබන්නේ කුමන උපකරණවල ද?**

ස්වෛරීත්ව ධන අරමුදල් සම්ප්‍රදායිකව ආරක්ෂාකාරී හා දිගුකාලීන අයෝජනයන් ය. ඒවා, පහත සඳහන් වත්කම් ඇතුළුව පුළුල් පරාසයක වත්කම් ගණනාවක ආයෝජනය කරනු ලබයි.

- රජයේ බැඳුම්කර (Government Bonds)
- සාමාන්‍ය කොටස් (Equities)
- සෘජු විදේශීය ආයෝජන (Foreign Direct Investments)

කෙසේ වුවද, අරමුදල් සංඛ්‍යාව වැඩිවන විට හෙජින් අරමුදල් (Hedge Funds), පෞද්ගලික කොටස් (Private Equity) වැනි සාමාන්‍ය ආයෝජකයින්ට ළඟා විය නොහැකි විකල්ප ආයෝජන මාර්ග කෙරෙහි යොමු වේ. නිතර වෙනස්වන නැගී එන වෙළෙඳපොළවල ආයෝජනය කරනු ලබන ස්වෛරීත්ව ධන අරමුදල් සම්ප්‍රදායික ආයෝජනවලට වඩා වැඩි අවදානමක් තිබෙන බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වාර්තා කර ඇත.✪

...18 වෙනි පිටුවෙන්

ආර්ථික, සමාජ හා දේශපාලන රටාවට ගැළපෙන ආකාරයට හැඩ ගැසෙමින් සෙමෙන් නමුත් තිරසාර ගමනක නියැලී සිටී. ඒ හමුවේ ඇති අභියෝග ජයගත හැකිවේ නම් අරමුදලෙහි නිර්මාතෘවරුන්ගේ අපේක්ෂා මල්ඵල ගන්වන්නට හැකිය. මේ සා විශාල අරමුදලක් ගොඩනැගුනේ සේව්‍යයන්, සේවකයන්, කම්කරු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව ආදී සියල්ලෙහි ම එකමුතුවෙන් සහ අන්‍යෝන්‍ය සහයෝගයෙනි. හෙට දින සඳහා ගැලපෙන වඩා ශක්තිමත් අරමුදලක් ගොඩනැගීම සඳහා මෙහි සාකච්ඡා කළ අභියෝග ජයගැනීමට ද කම්කරු දෙපාර්තමේන්තුවට හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවට මෙන් ම සාමාජිකයන් හා සේවායෝජකයින් වෙත ද සැලකිය යුතු වගකීමක් මෙන් ම කාර්යභාරයක් ද පැවරී ඇත්තේ ය.✪

**මූලාශ්‍ර:-**


1. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාව - 1957 හා 1958
2. ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා - 1960 සිට 2012
3. සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තා - 2002 - 2010
4. මෙහෙවර පියස සමරු කලාපය - කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය
5. 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සහ එයට අදාළ සංශෝධන ඇතුළත් පනත් කෙටුම්පත
6. මධ්‍යම අර්ථසාධක අරමුදල් මණ්ඩලය, සිංගප්පූරුව (Central Provident Fund Board - Singapore) - වාර්ෂික වාර්තාව 2011
7. මධ්‍යම අර්ථසාධක අරමුදල් මණ්ඩලයේ වෙබ් අඩවිය www.cpf.gov.sg


රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.